# EXERCISES.

ADAPTED TO

SIDAT-SANGARA

EDITED BY

**JOHN PEREIRA**

Head Master, Borella English School.

Formerly Head-Master of the Native Normal Institution.

Editor of Sidat-sangara, &c.,

**PUBLISHED BY**

**N. M. COORAY.**

PRINTED AT THE SESTRALOKA PRESS

**COLOMBO:**

**1876.**

# දැන්වීමයි.

## සිදත්සඟරා ලියන සන්නය.

මෙනම්හිත්සූත් සුළුප්‍රකරණය සන්ධිනාමාදියගේ ප්‍රසිද්ධි ක්‍රමය ප්‍රකාශිතහෙයින් සිංහල ව්‍යාකරණ ඉගෙනගන්නා සියල්ලදෙනාටම ඉතා ප්‍රයෝජනවැව් සලකා මෙනම්පොත් කීපයක් එකතුකොට හැකි පමනින් ශුද්ධකර ලියවා යළිත් බොරැල්ලේ ඉංග්‍රීසි පාඨශාලාවේ පළමුවෙනි ගුරුතනතුර බර්ණ ජෝන්පෙරේරා මහත්මයාලවා වරද හරිගස්වා නාවලගේ මත්තේස් කුරේ අප්පුහාමි වන මාවිසින් කොළඹ ශාස්ත්‍රාලෝක යන්ත්‍ර ශාලාවේදී අච්චුගස්වන ලදී.

මේපොත සහ වෙනත් නොයෙක් වර්ගවල සිංහලපොත් කොළඹ කච්චේරිය ඉදිරිපිට තිබෙන නොම්මර **24** රේ සාප්පුවෙන් සහ මහනුවර කොළඹවීදියේ නොම්මර **247** තේ ගෙදරින්ද ලබාගත හැකිය.

නමව් මුණිසරණ.

# සිදත්සඟරා ලියන සන්නය.

විදුරව්යේ-දිගා-දිනිසුරු-කනිල්-බමරුදුල-නොමරුල්-සඳෙව්-සලේගි-පහරෙන-ගඬෝනා,-කියා සංගිතාකායඹින් කළමනා තණ්ගි.

| | | | | |
|---|---|---|---|---|
| * 1 | විදුරු | කියාවේ | අව්යේ | කියා වේ |
| 2 | දිගු | ,, | ආ | කියා වේ |
| 3 | දින | ,, | ඉසුරු | කියා වේ |
| 4 | කනා | ,, | ඊල් | කියා වේ |

1 විදුරු-කීතණ්හි රකාරසර් උකාර පහවේ, රකාර හල්වේ.

2 දිගු-කීතණ්හි ගකාරසර් උකාර පහවේ, ඝකාර හල්වේ.

3 දින-කීතණ්ගි නකාසර් අකාරපහවේ, නකාර හල්වේ.

4 කනා-කීතණ්ගි නකාරසර් ඈකාර පහවේ, නකාර හල්වේ.

---

* විදුර් උ අව්යේ මෙහි පූර්වස්වරයහට ලොප් කොට පරස්වරය ගානුරූඪකල කල්හි විදුරව්යේ යනු සිඩයි-සෙසු තැණ්හිද මෙසේමැයි

| | | | | |
|---|---|---|---|---|
| 5 | බමර | කියාවේ | උදුල | කියාවේ. |
| 6 | නොමූර | ,, | ඌල් | කියාවේ. |
| 7 | සඳ | ,, | එව් | කියාවේ. |
| 8 | යල | ,, | ඒගි | කියාවේ. |
| 9 | පහර | ,, | ඔත | කියාවේ. |
| 10 | හඬ | ,, | ඕනා | කියාවේ. |

5 බමර-කීතණ්හි රකාරස්ථ අකාර පහවේ, රකාර හල්වේ.
6 නොමර-කීතණ්හි රකාරස්ථ අකාර පහවේ, රකාර හල්වේ.
7 සඳ-කීතණ්හි දකාරස්ථ අකාරපහවේ, දකාරහල්වේ.
8 යල-කීතණ්හි ලකාරස්ථ අකාර පහවේ, ලකාර හල්වේ.
9 පහර—කීතණ්හි රකාරස්ථ අකාර පහවේ, රකාර හල්වේ.
10 හඬ-කීතණ්හි ඬකාරස්ථ අකාරපහවේ, ඬකාරහල්වේ.

ස්වරයන් පරකල්හි පූර්වස්වරයන්ට—පෙර පර වර්ණන් නිසිවිදිනි ගලපනු සඳනම්-යන උපාඩග සූත්‍රයෙන් ලොප්වේ—පර අකාර ආකාර ඉකාර ඊකාර උකාර ඌකාර එකාර ඒකාර ඔකාර ඕකාර—ශාත්‍රාක්ෂරවූ රකාරාදීන්ට ආරූඪව-විදුරුඅවියේ දිගුආදින ඉසුරු කනා ඊල් බමර උදුල නොමර ඌල් සඳ එව් යල ඒගි පහර ඔත හඬ ඕනා—කියා පදබිඳ තුබූතණ්හි සංහිතාකාර්‍යයව—විදුරවියේ, දිගා, දිනිසුරු, කනීල්, බමරුදුල, නොමරූල්, සදෙව්, යලේගි, පහරෙත, හඬෝනා, යනු වේ—

### 1 පූර්වස්වරලොප සන්ධියයි.

ඌලේසුන්, සුස්මෙන්, නිපුණු, වැටූසිපත-කියා සංහිතාකාර්‍යයක් කලමනාතණ්හි

| | | | |
|---|---|---|---|
| 1 ඌලේ | කියාවේ | උසුන් | කියාවේ. |
| 2 සූ | ,, | උස්මෙන් | කියාවේ. |
| 3 නි | ,, | අපුණු | කියාවේ. |
| 4 වැටු | ,, | අසිපත | කියාවේ. |

1 ඌලේ-කීතණ්හි ලකාරයහි ඒකාර පහවේ ලකාර හල්වේ.

2 සූ-කීතණ්හි සකාරයහි උකාර පහවේ, සකාර හල්වේ.

3 නි-කීතණ්හි තකාරයහි ඉකාර පහවේ; තකාර හල්වේ.

4 වැටු-කීතණ්හි ටකාරයහි උකාරපහවේ, ටකාර හල්වේ.

ස්වරයන් කෙරෙත් පරස්වරයන්ට—පෙර පරවණන් නිසිවිදිනි ගලපනු සඳනම්-යන උපාධගසූත්‍රයෙන් ලොප්වේ-ඒකාර උකාර ඉකාර උකාරයෝ ගාත්‍රාක්‍ෂරවූ ලකාරාදීන්ට ආරූඪව-

ඌලේ උසුන්-සූඋස්මෙන්-වැටු අසිපත කියා පදබිඳ තුබූතණ්හි සංහිතාකායයීව-ඌලේ සූන් සූස්මෙන් නිපුණු වැටුසිපත යනුවේ.

2 පරස්වරලොප සන්ධියයි.

---

පසැස්කියා සංහිතාකායයීස් කලමනා තණ්හි-

පස් කියාවේ ඇස් කියාවේ.

මෙහි-පෙරපරවණන් යනාදී උපාධගසූත්‍රයෙන් පර ඇකාර ගාත්‍රාක්‍ෂරවූ සකාරයෙහි ආරූඪවේ-

පස්ඇස් කියා පදබිඳ තුබූතණ්හි සංහිතාකායයී ව පසැස් යනුවේ.

3 ස්වර සන්ධියයි.

---

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

මෙහෙසුරු-මොහොර-ලඹෝරා-කියා සන්හිතා කාර්‍යක්කලමනාතණ්හි.

| | | | |
|---|---|---|---|
| 1 | මහ | කියාවේ | ඉසුරු කියාවේ. |
| 2 | මහ | ,, | උර කියාවේ. |
| * 3 | ලඹ | ,, | උදර කියාවේ. |

1 මහ-කීතණ්හි හකාරසථ අකාරපහවේ, හකාර හල්වේ.

2 මහ-කීතණ්හි හකාරසථ අකාරපහවේ, හකාර හල්වේ.

3 ලඹ-කීතණ්හි ඹකාරසථ අකාරපහවේ, ඹකාර හල්වේ.

ස්වරයන් පර කල්හි පූර්වස්වරයන්ට—පෙරපරවණන්-යනාදී උපාධගසූත්‍රයෙන් ලොප්වේ-ලූනාස්වරයන් කෙරෙන් පර ඉකාර උකාරයන්ට-සදරුත් යනාදි අධගසූත්‍රයෙන්—එකාර ඔකාර ඕකාරාදේසවේ- මෙමසූත්‍රයෙන්-පූර්ව මකාරදෙදෙනාකෙරෙන් පරව එකාර ඔකාරාගමවේ-ලඹෝදර ශබ්දයාගේ දකාරයහට-සදරුත්-යනාදී සූත්‍රයෙන් නිරුත්තිලක්ෂණයෙන් ලොප්වේ-ප්‍රාණාක්ෂරවූ එකාරඔකාර ඕකාරයන් හකාර මකාර බකාරයන්ට-පෙරපරවණන් යනාදී උපාධනසූත්‍රයෙන් ආරූඪවේ-මහඉසුරු, මහඋර, ලඹඋදර, කියා පදබිඳනුබූ තණ්හිසංහිතා කාර්‍යව මෙහෙසුරු, මොහොර, ලඹෝරා,යනුවේ.

4 ස්වරාදෙස සන්ධියයි.

---

අත්වරු, සිත්වරු, මහණුවම්, දඬුවම්, ගිනියම්-කියා සංහිතාකාර්‍යක් කලමනාතණ්හි.

---

* ලඹෝර-ශබ්දයා කෙරෙන් පරව පෙරවිබත් එකබසෙහි ආ විබත් කොට පමුනුවා-ලඹෝරු-යි වෙ.

1 අත් කියාවේ කරු කියාවේ.
2 සිත් ,, කරු කියාවේ
* 3 මහණ ,, කම් කියාවේ.
4 දඬු ,, කම් කියාවේ.
5 ගිනි ,, කම් කියාවේ.

1 අත්කරු යනාදි තණ්හි අත් ආදි ශබ්දයන් කෙරෙන් පර කකාරයන්ට සදරුත් යනාදි අඩග සූත්‍රයෙන් වකාර යකාරාදෙසවේ-අත්කරු සිත්කරු මහණකම් දඬුකම් ගිනිකම් කියා පදබිඳතුබූ තණ්හි සංහිතාකාය්‍යීව අත්වරු සිත්වරු මහණුවම් දඬුවම් ගිනියම්-යනුවේ—කප්පිල් කැසුප් පොතු ලප්නාරඟ හෙප් තොට සුත් බත් බුත් සරණ-කියා සංහිතාකාය්‍යීක් කලමනා තණ්හි.

1 කබ කියාවේ පිල් කියාවේ.
2 කැසුබු ,, පොතු කියාවේ.
3 ලබු ,, නාරඟ කියාවේ.
4 හෙබ ,, තොට කියාවේ.
5 සුදු ,, බත් කියාවේ.
6 බුදු ,, සරණ කියාවේ.

1 කබපිල් යනාදි තණ්හි-බකාර දකාරයන්ගේ ස්වර පහව එම ස්වරයන්ට පෙරපරවණන් යනාදි උපාඩගසූත්‍රයෙන් ලොප්කොට ස්වර රහිත බකාර දකාරයන්ට එම සූත්‍රයෙන් පකාර තකාරාදෙසවේ-කබපිල්-කැසුබු පොතු-ලබුනාරඟ-හෙබ තොට-සුදුබත්-බුදුසරණ-කියා පදබිඳ තුබූතණ්හි සංහිතාකාය්‍යීව කප්පිල් කැසුප් පොතු ලප්නාරඟ හෙප් තොට සුත්බත් බුත්සරණ යනුවේ.

5 ගාත්‍රාදෙස සන්ධියයි.

---

* මහණුවම් යනතැන සුඛොච්චාරණය පිණිස උකාරාගමයි.

ඇත්තම්-වත්තම්-ගෙත්තම්-පණ්ණම්-විස්සම්-කියා සංහිතාකාර්‍ය්‍යයක් කළමනාතණ්හි.

1 අත් කියාවේ කම් කියාවේ.
2 වත් ,, කම් කියාවේ.
3 ගෙත් ,, කම් කියාවේ.
4 පත් ,, කම් කියාවේ.
5 විස් ,, කම් කියාවේ.

1 අත්වත් යනාදි තණ්හි ගාත්‍රාක්ෂරයන් කෙරෙන් පර කකාරයන්ට සදරුත් යනාදි සූත්‍රයෙන් පූර්‍වරූපවේ—අත්කම් වත්කම් ගෙත්කම් පත්කම් විස්කම් කියා පදබිඳ තුබූතණ්හි සංහිතාකාර්‍ය්‍යව—ඇත්තම් වත්තම් ගෙත්තම් පන්නම් විස්සම් යනුවේ.

6 පූර්‍වරූප සන්ධියයි.

---

ගංරන් යනාදිතණ්හි

1 ගඟ කියාවේ රන් කියාවේ.
2 වඟ ,, මූත්‍ර කියාවේ.
3 මුඟු ,, බියලි කියාවේ.
4 නෙලුඹු ,, මල් කියාවේ.
5 අඹ ,, මල් කියාවේ.

1 ගඟ වඟ යනාදි තණ්හි පෙරපරවණන් යනාදි සූත්‍රයෙන් ඟකාර ඹකාරයන්ට ලොප්වේ සදරුත් යනාදි සූත්‍රයෙන් මාත්‍රා වැඩිව-ගඟ රන් වඟ මූත්‍ර මුඟු බියලි නෙලුඹු මල් කියා පදබිඳ තුබූතණ්හි සංහිතා කාර්‍ය්‍යව-ගංරන් වම්මූත්‍ර මුංබියලි නෙළුම්මල් අම්මල් යනුවේ.

7 ගාත්‍රාක්ෂර ලෝප සන්ධියයි.

---

පිරියත්—*—මිසුඟුණු-සිපියෙව්-දුවග- රුවාරු, තුනුවග-පුනරුත්-නිරෙද-කියා සංහිතා කායඊක් කලමනා තණ්හි.

1 පිරි කියාවේ අත් කියාවේ.
2 මි ,, අගණ කියාවේ.
3 සිපි ,, එව් කියාවේ.
4 දු ,, අග කියාවේ.
5 රු ,, අරු කියාවේ.
6 තුනු ,, අග කියාවේ.
7 පුන ,, උත් කියාවේ.
8 නි ,, ඔද කියාවේ.

1 පිරිඅත් යනාදි තණ්හි පූර්ව ප්‍රාණාක්ෂරයන් කෙරෙන් පරව-පෙර පරවණන්-යනාදිසූත්‍රයෙන්-යකාර වකාර රකාරාගමවේ-එම සූත්‍රෙන්ම යටසි ටි ප්‍රාණාක්ෂරා රුඑව-පිරියත් මිසුගුණු යනාදියවේ.

8 ආගම සන්ධියයි.

---

වැල්ලවුරු-හෙලිල්ලඹු-තඹපල්ලෙන්- කුල්ලෙ ව්-කියා සංහිතා කායඊක් කලමනා තණ්හි.

1 වැලි කියාවේ අවුරු කියාවේ.
2 හෙලිලි ,, අඹු කියාවේ.
3 තඹපලු ,, එන් කියාවේ.
4 කුළු ,, එව් කියාවේ.

1 වැලිඅවුරු යනාදි තණ්හි පූර්වස්වරයන්ට-පෙර පරවණන් යනාදි උපාධග සූත්‍රයෙන් ලොප්වේ-ස්වරයන් කෙරෙන් පූර්වලකාරයනට-සදරුත් යනාදි සූත්‍රයෙන් විත්වවේ-එම්සූත්‍රයෙන් ප්‍රාණාක්ෂර ගාත්‍රාක්ෂරාරුඑව—වැල්ලවුරු හෙලිල්ලඹු තඹපල්

---

* මිසුගුණුයන තණ්හිපිලි විපර්යාසය වේ.

ලෙත් කුල්ලෙවූ යනුවේ.

9 විභරූප සනධියයි.

---

## 2 සනාධනධි කාරණම්වූ විතීය කාණ්ඩයයි.

1 පෙර විබත් { ඒකවචන-ඒ, ආ, අ.
බහුවචන-ඕ, හු, උ.

2 කම් විබත් { ඒක-අ, උ, ආ, හු, ට.
බහු-උන්, න, ආන, න්, නට, අ, [න්, නත්

3 කතු විබත් { ඒක-අ, උ, ආ, හු.
බහු-උන්, න, ආන, න්, අන්.

4 කරණ විබත් { ඒක-ඉන්, එන්, නෙන්, ඉනි, එනි, නෙනි, නි, වලින්, ගෙන්.
බහු-ඉන්, එන්, නෙන්, ඉනි, එනි, නෙනි, වලින්, ගෙන්.

5 සපදන්විබත් { ඒක-හට, අට, උට, ආට, හුට, ට.
බහු-අනට, උන්ට, නට, ආනට, න්ට, අන්ට.

6 අවදි විබත් { ඒක-ඉන්, එන්, නෙන්, නි, ඉනි, එනි, නෙනි, අගෙන්, උගෙන්, ආගෙන්, හුගෙන්.
බහු-ඉන්, එන්, නෙන්, නි, ඉනි, එනි, නෙනි, උන්ගෙන්, නගෙන්, ආන ගෙන්, න්ගෙන්, අන්ගෙන්.

7සබඳ විබත් { ඒක-හට, අට, උට, ආට, හුට, ට, අ, උ, ආ, හු, අගෙ, උගෙ, ආගෙ, හුගෙ.
බහු-අනට, උන්ට, නට, ආනට, න්ට, අන්ට, උන්, න, ආන, න්, අන්, උන්ගෙ, නගෙ, ආනගෙ, න්ගෙ, අන්ගෙ.

8 අදර විබත් { ඒක-එහි, ඒ, හි, ඇ.
බහු-අන්හි.

9 අලප් විබත් { ඒක-ඇ, අ, ආ, ඒ.
බහු-ඉන්, එන්, නෙන්, ඉනි, එනි, නෙනි, නි.

බෙලේ හරායන තරණි, බලශබ්ද බලකියාවේ හරශබ්ද හරකියාවේ, කම්ාදින්විසින් අවිශිෂ්ටවූ අර්ථයක් දෙනකත කලහි, බජන්තුයේ පෙරවිබත්, ය නාදි උපාඩගසූත්‍රයෙන් ප්‍රථමා විභක්තිවෙයි-එන් නොහිදු ඒකාර්ථ මාත්‍රයක් දෙනකතකලනි-ඒවිභක්ති හා ආවිභක්තිවේ—බකාරසථ අකාර පහවේ බකාර හල්වේ රකාරස්ථ අකාර පහවේ රකාර හල්වේ ඒ විභක්ති ආවිභක්ති පරකලනි-පූර්ව ප්‍රාණක්ෂරයන්ට සඳරුත් යනාදි අඩග සූත්‍රයෙන් ලොප්වේ—පර ඒකාර ආකාර සඳරුත්යනාදි අඩගසූත්‍රයෙන් ගාත්‍රා ක්ෂරවූ බකාර රකාරයන්ට ආරූඪවේ බකාරයාට සඳරුත් යනාදි අඩගසූත්‍රයෙන් පිලිපෙරලි කල ක ල්හි බෙලේහරා යනුවේ—

බමණෝ තවසරහු, යනතණ්හි බමණ ශබ්ද බමණකියාවේ තවසර ශබ්දතවසර කියාවේ, බම ණ තවසරයන තණ්හි බහවාර්ථයක් දෙනකතකල් හි බහුවචනවූ ඕ විභක්තිහා හු විභක්තිවේ පූර්ව ප්‍රාණක්ෂරයන්ට සඳරුත් යනාදි අඩගසූත්‍රයෙන් ලොප්කොට ඕ විභක්ති ගාත්‍රා රූඪකල කල්හි බමණෝ තවසරහු යනුවේ—

නිඳැලියෝ පඩුවෝ යන, තණහි, නිඳැලි පඩු ශබ්දයන් කෙරෙන් පරව මෙසේම බහවාර්ථයෙහි ඕ විභක්තිව ඕ විභක්ති පරකල්හි ශබ්දයන් කෙ රෙන් පරව සඳරුත් යනාදි සූත්‍රයෙන් යකාර වකා රාගම්ව ගාත්‍රාක්ෂරාරූඪ කලකල්හි නිඳැලියෝ පඩු වෝ යනුවේ—

## 1 මේප්‍රථමාවිභක්තියි.

කර්තෘහුගේ ගමන පචනාදි ක්‍රියාවෙන් ප්‍රාප්තවූ ශබ්දාර්ථය කර්මනම්වේ—එහි, මිය යනතණහි මි ශබ්දයා කෙරෙන් පරව බජන්තුයේ පෙර විබත් ය නාදි උපාඩග සූත්‍රයෙන් කර්මකාරකෙක වචණ

සංඥ කරණලද අ විභක්ති වේ යකාරාගමකොට පූර්ව ප්‍රාණාක්ෂරයාට ලොප්කොට ගාත්‍රාක්ෂරාරූඪකල කල්හි මිය යනුවේ— සිදුහත්කුමරු යනතණ්හි සිදුහත් කුමර ශබ්දයාකෙරෙන් පරව උ විභක්ති ව ගාත්‍රාක්ෂරාරූඪව සිදුහත් කුමරු යනු වේ—

රවුලා යනතණ්හි රවුල් ශබ්දයාකෙරෙන් පරව ආ විභක්තිව ගාත්‍රාක්ෂරාරූඪව රවුලා යනු වේ—

සුරඟු යනතණ්හි සුරශබ්දයා කෙරෙන් පරව ගුවිභක්තිව සුරඟු යනුවේ—

රජගෙට යනතණ්හි රජගෙ ශබ්දයාකෙරෙන් පරව ට විභක්තිව රජගෙට යනු වේ—

මහණුන් යනතණ්හි මහණ ශබ්දයා කෙරෙන් පරව බජනුයේ පෙරව්බත් යනාදි උපාඩග සූත්‍රයෙන් කර්මකාරක බහුවචන සංඥකරණලද උන් විභක්තිවෙ පූර්වස්වර ලොප්ව ගාත්‍රාක්ෂරාරූඪ කල කල්හි මහණුන් යනු වේ—

පිලිමල්නා යනතණ්හි පිලිමල් ශබ්දයාකෙරෙන් පරව නා විභක්තිව පිලිමල්නා යනු වේ—

මොනරාන යනතණ්හි මොනර ශබ්දයා කෙරෙන් පරව ආනවිභක්තිව පූර්වස්වර ලොප්ව ගාත්‍රාක්ෂරාරූඪව මොනරාන යනුවේ—

දනන්, යනතණ්හි දන ශබ්දයාකෙරෙන් පරව න් විභක්තිව දනන්යනු වේ—

රුක්නට යනතන්හි රුක් ශබ්දයා කෙරෙන් පරවනට විභක්තිව රුක්නට යනුවේ—

දරුවන්, යනතන්හි දරුශබ්දයා කෙරෙන් පරව අන් විභක්තිවසදරුන් යනාදි අංඩගසූත්‍රයෙන් වකාරාගමව ගාත්‍රාක්ෂරාරූඪව දරුවන් යනුවේ—

සේනන්, යන ප්‍රයෝගය කෙසේ වීදයත්—

උත්තා නන් නටන් යන සූත්‍රයෙනි නාන් යන ශබ්දයා ශ්‍රූයමාන නුයිනන් විභක්තියක්ද ඇතැයි

සම්ප්‍රතිපත්ති කටයුතුවන බැවින් නත් විභක්තිව සේනත් යනුවේ—

මුරුනට යනතණ්හි මුරුශබ්දයා කෙරෙන් පරව නට විභක්තිව මුරුනටයනුවේ— මවට යනතණ්හි මවශබ්දයා කෙරෙන් පරව ට විභක්තිව මවට යනුවේ—

බුදුන්කරා එලඹැ යන අර්ථයෙහි ෂෂ්ඨී බහුවච නවූ බුදුන් ශබ්දය හට සම්පාප්තවූ කර ශබ්දයා කෙරෙන් පරව කර්මකාරකයෙක වචනවූ ආ විභක්තිව ගාත්‍රාරූඪ කලකල්හි බුදුන්කරා එලඹැ යනුවේ—

## මේ කර්මකාරකයි—

අන්‍යයක්හු විසින් ගමන පචනාදි ක්‍රියාව කෙරෙද ඒ තෙමෙ කර්තෘනම්වේ එහි රදුව යනතණ්හි රද ශබ්දයා කෙරෙන් පරව බජනුයේ පෙරව්බත් යනාදි උපාධග සූත්‍රයෙන් අ විභක්තිව අව්භක්ති පරකල්හි රදශබ්දයා කෙරෙන් පරව සදරුත් යනාදී අඩගසූත්‍රයෙන් වකාරාගමව ගාත්‍රාරූඪ කොට පිළිපෙරළිකල කල්හි රදුව යනුවේ—

රජු යනතණ්හි රජ ශබ්දයා කෙරෙණ් පරව උ විභක්තිවගාත්‍රාරූඪව රජු යනුවේ—

මුනිඳු යනතණ්හි මුනිඳු ශබ්දයා කෙරෙණ් පරව ආ විභක්තිව ගාත්‍රාරූඪ කලකල්හි මුනිඳු යනුවේ—

පින් සිපිහු යනතණ්හි සිපි ශබ්දයා කෙරෙණ් පරව බහුවචන හු විභක්තිව පින්සිපිහු යනුවේ—

දඳුන් යනතණ්හි දද ශබ්දයා කෙරෙණ් පරව උන් විභක්තිව දඳුන්යනුවේ—

මීපල්න යනතණ්හි මීපල් ශබ්දයාකෙරෙණ් පරව න විභක්තිව මීපල්න යනුවේ—

නරා යනතණ්හි නර ශබ්දයා කෙරෙණ් පරව ආන විභක්තිව ගාත්‍රාරූඪව නරාන යනුවේ—

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

කිවින් යනතණ්හි කවිශබ්දයා කෙරෙණ් පරව ත් විභක්තිව පිලිපෙරළි කලකල්හි කිවින් යනු වේ—

අගනන් යනතණ්හි අගන ශබ්දයා කෙරෙණ් පරව අන්විභක්තිව පූර්ව ප්‍රාණාක්‍ෂරයාහට ලොප්ව ගාත්‍රාරූඪව අගනන් යනුවේ—

තෙනෙත්නු විසින් යනතණ්හි තිනෙත් ශබ්දයා කෙරෙණ් පරව හු විභක්තිව පිලිපෙරළි කරණු විසින් යනනක්ද මෙහි අභිමතයි—

සුගතිඳුහා යනතණ්හි සුගතිඳු ශබ්දයා කෙරෙණ් පරව කර්තෘකාරක යෙහි සුගතෙඳුයා හා යන යොගයෙහි හා යන්නක් යුක්තකොට සුගතිඳුහා යනුවේ—

මෙසේම බහුවචන න් විභක්තිව හා යන යොගයෙහි වණන්හා යනුවේ—

මේ කර්තෘකාරකයි—

කර්තෘහුගේ ක්‍රියා සම්පාදනය කිරීමෙහි අත්‍යන්තොපකාර වූයේ කරණනම් වේ—

ඒ කරණවිබත් දෙබසෙහිම සමානයි—

එහි වතින් යන තණ්හි වත්ශබ්දයා කෙරෙන් පරව කරණ කාරකෙක වචනයෙහි බජනුයෙ පෙරවිබත් යන උපාධග සූත්‍රයෙන් ඉන් විභක්තිව ගාත්‍රාරූඪව වතින් යනුවේ—

ගුණෙන් යනතණ්හි ගුණ ශබ්දයා කෙරෙන් පරව එන් විභක්තිව ගාත්‍රාරූඪව ගුණෙන් යනු වේ—

මෙත්නෙත් යනතණ්හි මෙත්ශබ්දයා කෙරෙන් පරව නෙන් විභක්තිව මෙත්නෙත් යනුවේ—

සිතිනි යනතණ්හි සිත්ශබ්දයා කෙරෙණ් පරව ඉනි විභක්තිව සිතිනි යනුවේ—

නියෙනි යන තණ්හී නියශබ්දයා කෙරෙණ් පරව එනි විභක්තිව නියෙනි යනුවේ

තැත්නෙනි යනතණ්හි තත්ශබ්දයා කෙරෙණ් පරව නෙනි විභක්තිව මාත්‍රාවෘඩිව තැත්නෙනි යනුවේ

ගියමගි ශබ්දයා කෙරෙණ් පරව නි විභක්තිව ගියමගිනි යනුවේ

මිනිපඬුරු ශබ්දයා කෙරෙණ් පරව උපලක්‍ෂණාර්‍ථයෙහිද කරණ විභක්ති අභිමතබැවින් එන් විභක්තිව මිනිපඬුරෙන් යනුවේ

## මේ කරණ කාරකයි

යමක් හටය පිනිසය යන ශබ්දාර්‍ථයෙහි සම්ප්‍රදාන විභක්තිවේ

එහි මරහට යනතණ්හි මරශබ්දයා කෙරෙණ් පරව බජනුයේ පෙර විබත් යනාදී උපාධගසූත්‍රයෙන් සම්ප්‍රදාන කාරකෙක වචනයෙහි හට විභක්තිව මරහට යනුවේ

උකටලියට යනතණ්හී උකටලි ශබ්දයා කෙරෙණ් පරව අට විභක්තිව යකාරාගමව උකටලියට යනුවේ

රජුට යනතණ්හී රජශබ්දයා කෙරෙන් පරව උට විභක්තිව රජුට යනුවේ

යදියාට යනතණ්හි යදි ශබ්දයාකෙරෙණ් පරව ආට විභක්තිවයකාරාගමව යදියාට යනුවේ

වෙලඳ ශබ්දයාකෙරෙණ් පරව හුට විභක්තිව වෙලඳහුට යනුවේ

මෙගෙ ශබ්දයාකෙරෙණ් පරව ට විභක්තිව මෙගෙට යනුවේ

මහත් ශබ්දයා කෙරෙණ් පරව බහුවාර්‍ථයෙහි උන්ට විභක්තිව ගාත්‍රාරූඪ කලකල්හී මහතුන්ට යනුවේ

පරශබ්දයා කෙරෙණ් පරව නට විභක්තිව පර
නට යනුවේ

තඹර ශබ්දයාකෙරෙන් පරව ආනට විභක්තිව,
ගාත්‍රාරූඪකොට තඹරානට, යනුවේ

උරරුපු ශබ්දයාකෙරෙන් පරව බහුවාර්‍ථයෙහි
න්ට විභක්තිව උරරුපුන්ට, යනුවේ

මෙහෙලි ශබ්දයාකෙරෙන් පරව අන්ට විභක්ති
ව යකාරාගමකොට මෙහෙලියන්ට, යනුවේ

පුදනුශබ්දයා කෙරෙන් පරව අනට විභක්තිව
වකාරාගම කොට ගාත්‍රාරූඪව පුදනුවනට යනු
වේ

සටන් ශබ්දයා කෙරෙන් පරව පිනිසය යනඅ
ර්‍ථයෙහි අට විභක්තිව සටනට, යනුවේ

මගුලටයනුද මෙසේමැයි

දෙන්ශබ්ද කොටන් ශබ්දයන් කෙරෙන් පරව
නටවිභක්තිව දෙන්නටකොටනාට, යනුවේ

බුදු ශබ්දයා කෙරෙන් පරව නට විභක්තිව වකා
රාගමකොට විත්වරූපව බුදුවන්නට, යනුවේ

මෙම අරුතෙහි වස් යන්නක්ව බුදුවන්න වස්,
කියාවේ

මේ සම්ප්‍රදානකාරකයි.

පදාර්‍ථයන්ගේ ප්‍රවෘත්තියට සීමාවූයේ අවදිකාර
කනම්වේ

එහි සෙලින්යනතණ්හි සෙලශබ්දයා කෙරෙන්
පරව අවදිකාරකෙක වචනයෙහි බජන්නුයේ පෙ
රව්භත් යන උපාඩගසූත්‍රයෙන් ඉන් විභක්තිව ප්‍රා
නාක්‍ෂර ලොප් කොට ගාත්‍රාරූඪ කළකල්හි සෙ
ලින්, යනුවේ

ඇහැන ශබ්දයාකෙරෙත් පරව එන් විභක්තිව
ඇහැනෙන්, යනුවේ

රුක් ශබ්දයාකෙරෙන් පරව නෙන් විභක්තිව
රුක්නෙන්, යනුවේ

හිරි ශබ්දයා කෙරෙන් පරව අගෙන් විභක්තිව යකාරාගමව හිරියගෙන්, යනුවේ—

සොර ශබ්දයාකෙරෙන් පරවඋගෙන් විභක්තිව ගාත්‍රාරූඪව සොරුගෙන්, යනුවේ—

පරාගෙන් යනතැන්හි පර ශබ්දයා කෙරෙන් පරව බජනුයේ පෙරවිබත් යන උපාධග සූත්‍රයෙන් ආගෙන් විභක්තිව ගාත්‍රාරූඪ කලකල්හි පරාගෙන්, යනුවේ—

මුනිඳු ශබ්දයා කෙරෙන් පරව හුගෙන් විභක්තිව මුනිඳු හුගෙන්, යනුවේ—

වර ශබ්දයාකෙරෙන් පරව ඉන්විභක්තිව වරින්, යනුවේ—

සම්පාත්ථයෙහි එන් විභක්තිව රිවිහු කෙරෙන්, යනුවේ—

නරන්කෙරෙන් යනුද රුවනානුරෙන් යනුද නිර්ධාරණාර්ථයෙහි එන් විභක්ති යොදනු—

බහ්වාර්ථයෙහි අන් ගෙන් විභක්තිව යන්නාන් ගෙන්, යනුවේ—

මේආදිවූ නිර්ධාරණාර්ථයෙහි අවදි විභක්ති අභිමතයි—

ජාත්‍යාදීන් එක් දේසයක් වෙන්කිරිම නිර්ධාරණ නම්වේ—

## මේ අවදි කාරකයි.

අන්‍යෝන්‍ය ප්‍රතිබද්ධ වස්තූන් ගෙන් විශෙෂණ කරණ වස්තුව සම්බන්ධ, නම්වේ—

එහි-තමහට යනතැන්හි තමශබ්දයා කෙරෙන් පරව බජනුයේ පෙරවිබත් යන උපාධග සූත්‍රයෙන් හට විභක්තිව තමහට, යනුවේ—

තිලො ශබ්දයා කෙරෙන් පරව අට විභක්තිව වකාරාගමව තිලොවට, යනුවේ—

මුනිහිරු ශබ්දයා කෙරෙන් පරව උටවිභක්තිව ගාත්‍රාරූඪ කලකල්හි මුනිහිරුට, යනුවේ—

ආට විභක්තිව යකාරාගම කුළුණැතියාට, යනුවේ—

මේආදිය යොදනු—

ගිරිඳු ශබ්දයාකෙරෙන් පරව අගේ විභක්තිව වකාරාගමකොට ගිරිඳුවගේ, යනුවේ—

සඳ ශබ්දයාකෙරෙන් පරව උගේ විභක්තිව සඳුගේ, යනුවේ—

තුනුවග ශබ්දයාකෙරෙන් පරව ආගේ විභක්තිව තුනුවගාගේ, යනුවේ—

සැසි ශබ්දයා කෙරෙන් පරව හුගේ විභක්තිව සැසිහුගේ, යනුවේ—

සිරිවම් ශබ්දයාකෙරෙන් පරව ගෙයනු විප්‍රුක්ත අවිභක්තිකොට යකාරාගම කලකල්හි සිරිවමිය, යනුවේ—

මුනිවිර ශබ්දයා කෙරෙන් පරව එසේම උ විභක්තිව මුනිවිරු, යනුවේ—

දුම්යොනි ශබ්දයාකෙරෙන් පරව ආ විභක්තිව දුම්යොනා, යනුවේ—

රජ ශබ්දයා කෙරෙන් පරව ගෙයනු විප්‍රුක්තහු විභක්තිව රජහු, යනුවේ—

මේ ආදිය යොදනු—

සියපානට වඩා, පැලලූප් නුවරට මහ බෝමැඩට මේආදියෙහි අවධිකාරකාර්‍ථ යෙහි සම්බන්ධ විභක්ති අභිමතයි—

## මේසම්බන්ධ විභක්තියි.

කර්‍තෘකර්‍මදෙකට භාරවූ ක්‍රියාවදරන්නේ ආධාර නම්වේ—එහි—කුලෙහි යනතණ්හි කුලශබ්දයාකෙරෙන් පරව බජනුයෙ පෙරවිබත් යන උපාධනසූත්‍රයෙන් එහි විභක්තිව පූර්ව ප්‍රාණාක්ෂර ලොප් ව සඳරුත් යනාදී අඩන සූත්‍රයෙන් එ විභක්ති

ගාත්‍රාක්ෂරවූ ලකාරයාහට අරුඬ කාලකල්හි කුලෙ හි, යනුවේ.

එපුර ශබ්දයාකෙරෙන් පරව ඒ විභක්තිව එපු රේ, යනුවේ.

සිත්ශබ්දයා කෙරෙන්පරව හි විභක්තිව සිත්හි, යනුවේ.

මුනි ශබ්දයා කෙරෙන් පරව ඇ විභක්තිව මුනි බසැ, යනුවේ.

තඹර ශබ්දයා කෙරෙන් පරව බහ්වාර්ථයෙහි අන්හිවිභක්තිව තඹරන්හි, යනුවේ.

යොනන් ශබ්දයට සමීපාර්ථවූ කර ශබ්දයාකෙ රෙන් පරව එහිවිභක්තිකොට පිළිපෙරළි කළ කල්හි, යොනන් කෙරෙහි, යනුවේ.

ආධාරාර්ථයෙහි කර්මකාරක ආ විභක්තිව යකාරා ගමව දී ප්‍රත්‍යය කලකල්හි රත්සාදි, යනුවේ.

එසේම කාලාර්ථ ක්‍රියාවිෂයෙහි ආධාරාර්ථයෙහි කර්මකාරක අවිභක්තිව හමුවත, යනුවේ.

මේ ආධාර කාරකයි.

අනභිමුඛයා අභිමුඛකිරීමයයි කියනලද ආමන් ත්‍රනය ආලපන, නම්වේ.

පුත් ශබ්දයා කෙරෙන් පරව බජනුයේ පෙරවි බත් යන උපාඬග සූත්‍රයෙන් ඇ විභක්තිව ගාත්‍රා රුඬකොට පුතැ, යනුවේ.

එසේම අවිභක්තිව මහරජ, යනුවේ.

ආවිභක්තිව හෙසඳා, යනුවේ.

සවන ශබ්දයා කෙරෙන් පරව බහ්වාර්ථයෙහි ඉන්විභක්තිව සවනින්, යනුවේ.

නෙන් විභක්තිව සත්නෙන්, යනුවේ.

ඉනිවිභක්තිව නෙතිනි, යනුවේ.

එනි විභක්තිව මහනෙනි, යනුවේ.

නි විභක්තිව බිඟුනි, යනුවේ.

නිර්විභක්තිව නියවත්නී, යනුවේ—
මේ ආලපන විභක්තියි—

නාමකාණ්ඩය නිමි—

---

නානාප්‍රකාරාර්ථ ශබ්දයන් සම්බන්ධව ඒකාර්ථ යක් ප්‍රකාශකිරීම සමාසයයිකියා පූර්වාචාරිවරයන් විසින් කියනලදී—

එහි විභාගනම්—

අව්‍යසමාසය විභක්තිසමාසය විශෙෂන සමාස ය අන්‍යාර්ථ සමාසය දකාරාර්ථ සමාසයයි පස්වැ දැරුම්වේ එහි—

යව් දිව් යනතණ්හි යව් ශබ්දයා යව් කියාවේ.

ඔහුකෙරෙන් පරව බජනුයේ පෙරවිබත් යනා දින් ප්‍රථමාඒකවචන සංඥකරණලද ආවිභක්තිවේ.

නිපාතයා කෙරෙන් පර ආ විභක්තිහට සදරුත් යනාදිඅඞගසූත්‍රයෙන් ලොප්වේ—

දිව්ශබ්ද දිව් කියාවේ ඔහුකෙරෙන් පරව බජනු යේ පෙරවිබත්යනාදි සූත්‍රයෙන් ප්‍රථමා ආ විභක්ති වේ—

හිම් යන වාක්‍යය හිම් කියාවෙ යව් දිව් යන වාක්‍යයෙහි ජීවිත සීමාව දක්වා යනාර්ථයෙහි උප සගී නිපාතාදිගුපරපද නාමයන්හා යම්කලෙක්හි සමාස කරණු ලැබෙද්ද එකල්හි ඒ සමාසය සද රුත් විදිසියල් අනුරූසෙ පියොනන් යන අඞගසූත්‍ර යෙන් අව්‍යය සමාසසංඥවෙ උක්තාර්ථවූ වාක්‍යය හට සදරුත් යනාදි අඞග සූත්‍රයෙන් අප්‍රයොගවේ වාක්‍යයහට අප්‍රයොගකලකල්හි පූර්වොත්තර පද යන් සම්බන්ධවූ විභක්තින්ට සදරුත් යනාදි අඞග සූත්‍රයෙන් ලොප්වෙ විභක්තින්ට ලොප්කළකල්හි

ස්වරාන්ත ප්‍රකෘතිහට සඳරුත්, යනාදීන් ප්‍රකෘතිවත්
වෙ සමාසයා තමා අලිඟුහෙයින් සඳරුත් යනාදී
අඞගසූත්‍රයෙන් නම්වත්ව ඔහු කෙරෙන් පරව ප්‍රථ
මා ඒකවචනවූ ආ විභක්තිවෙ වකාරසථ ඉකාර
පහවෙ වකාරහල්වේ ආ විභක්ති පරකල්හි ප්‍රාණ
ක්‍ෂරය හට සඳරුත් යනාදීන් ලොප්වෙ ආ විභ
ක්තිහට එම සූත්‍රයෙන් ලොප්ව දිව්ගිම්යන වා
ක්‍යයෙහි යව්දිව්, යනුවේ—

යතලබ යනතණ්හි යත ශබ්ද යත කියාවේ.
ඔහු කෙරෙන් පරව ආවිභක්තිව ලොප්ව යම්
යම් යන වාක්‍යව ලබ ශබ්දයා කෙරෙන්පරවූ ආ
විභක්ති හට ලොප්ව යම් යම් යන වාක්‍යයෙහි
උපසර්ග නිපාතාදීන්ගේ යොගයෙහි වාක්‍යයහට
අප්‍රයෝගීව ප්‍රකෘතිවත්ව නම්වත්ව විභක්තිහට
ලොප්ව යතලබ, යනුවේ—
යතව්දි යනතණ්හි යතපූර්වූවිදි ශබ්දයාගේවි
භක්තිහට ලොප්ව යකාරාගමව නොඉක්ම යනවා
ක්‍යව විදිය නොඉක්මයන වාක්‍යයෙහි වාක්‍යයහට
අප්‍රයොගීව ප්‍රකෘතිවත්ව නම්වත්ව යතවිදි, යනුවේ.
අනුපූර්වූ පැසුළු බල යනතණ්හි වාක්‍යයහට
අප්‍රයොගීව ප්‍රකෘතිවත්ව නම්වත්ව කළකල්හි අනු
බල යනුවේ —

මේ යවාදි සමාසයි.

කුපූර්වූ ගර්හාලද පුරුෂතෙම යනා අර්ථයෙහි ගැ
රහුම්ලද යන වාක්‍යයහට අප්‍රයොගීව නම්වත්ව
විභක්ති ලොප්ව කුපුරිස්, යනුවේ—
දු ශබ්දයා කෙරෙන් පරවූ නිදියන වාක්‍යයහට
අප්‍රයොගීව ප්‍රකෘතිවත්ව නම්වත්ව දුලද, යනුවේ.
මෙසේම මනායන වාක්‍යයහට අප්‍රයොගීව සුව
ද, යනුවේ.

මේ කුආදිසමාසයි.

පබ් යනතැන්හි පබ් ශබ්දයා කෙරෙන් පරව වි භක්තිහට ලොප්ව උකටින් හොබනේ යන වාක්‍ය ව උත්කෘෂ්ටයෙන් සොභමානවන්නේය යනඅර්ථ යෙහි වාක්‍යයහට ලොප්ව ප්‍රකෘතිවත්‍ව නම්වත්‍ව පබ, යනුවේ.

උපවන යනතැන්හි වෙතවන යනවාක්‍යයහට අප්‍රයොගීව මතුලෙසින් විධිව උපවන, යනුවේ.

මේ පආදි සමාසයි

නපුවිවූ සුරනොවන්නේ යනතැන්හි වාක්‍යයා හට අප්‍රයොගවපූර්ව නකාරයහට අකාරවනොවන් නේ යනවාක්‍යයහට අප්‍රයොගව අසුර, යනුවේ.

න ශබ්දයා කෙරෙන් පරව ඔ විභක්තිව නො දෙනලද්දේ යනවාක්‍යව අප්‍රයොගීව විභක්තිහට ලොප්ව ප්‍රකෘතිවත්‍ව පූර්ව නකාරය හට අකාරව මධ්‍යයෙ යකාරාගමව විභක්තිහා ප්‍රාණාක්ෂර ලො ප්ව යකාරය හට පිලිපෙරැලි කළකල්හි අසිත්, යනුවේ.

අකුසල් ශබ්දයා කෙරෙන් පරව කුසල් නො වන්නේ යන වාක්‍යයහට අප්‍රයොගීව අකුසල්, යනුවේ.

මේ නකාරාර්ථ සමාසයි.

අන ශබ්දයා කෙරෙන් පරව එකෙක් නොවනු යේ යන වාක්‍යයහට අප්‍රයොගීව නම්වත්‍ව ඔහු කෙරෙන් පරව ඒ විභක්තිව ගාත්‍රාරූඪ කළකල්හි අනෙ, යනුවේ.

අදර ශබ්දයා කෙරෙන් පරව නකාරාගමකොට වාක්‍ය අප්‍රයොගව නම්වත්‍ව විභක්ති ලොප්ව අ නාදර, යනුවේ.

මේ ආදිය පරීක්ෂාකරණු.

මේ අව්‍යය සමාසයි.

ගත්කරු යනතණ්හි ගත ශබ්දයා කෙරෙන් පරව අවිභක්තිව විභක්තිහට ලොප්ව කරණශබ්ද කරණකියාවේ ඔහු කෙරෙන් පරව ප්‍රථමා එකවචන සංඥකරණලද ඒ විභක්තිවෙ ඒ විභක්ති පර කල්හි කරණශබ්දයාකෙරෙන් පරව සඳරුත්යනාදී සූත්‍රයෙන් යකාරාගමකොට නකාරයහට පිලිපෙරළිව විභක්ති ගාත්‍රාරූඪකොට ගතකරණුයෙ යන වාක්‍යයෙහි ප්‍රථමාලපන රහිතවූ අවශේෂ සප්තවිභක්ත්‍යන්ත පදයන් පරපද නාමයන්හා යම්කලෙක්හි සමාසකරණු ලැබෙද්ද එකල්හි ඒ සමාසය සඳරුත් විදිසියල් යනාදී සූත්‍රයෙන් සමාසවෙයි ඔහට එමසූත්‍රයෙන් විභක්ති සමාස සංඥව විභක්තිහටලොප්ව ප්‍රකෘතිවත්ව නම්වත්ව උවිභක්තිව නකාරයහට ලොප්ව පූර්වපදයා සම්බන්ධිවූ ප්‍රාණාක්ෂරය හටලොප්ව ගාත්‍රාරූඪ කළ කල්හි ගත්කරු, යනුවේ—

කිඩිකරණුයෙ යන වාක්‍යයෙහි විභක්ති හට ලොප්ව ප්‍රකෘතිවත්ව නම්වත්ව නකාරයාහට ලොප්ව වන පෙරළි කලකල්හි කිඩියර, යනුවේ—

මි ශබ්දයාකෙරෙන් අවිභක්ති පර කල්හියකාරාගමකොට විභක්ති ලොප්ව පල් ශබ්දයාකෙරෙන් එවිභක්තිව නකාරාගමකොට ගාත්‍රාරූඪව මියපල්නේයන වාක්‍යයෙහි විභක්තිහට ලොප්ව ප්‍රකෘතිවත්ව මි ශබ්දයහට මාත්‍රාවෘද්ධිවම්පල්, යනුවේ—

මි ශබ්දය හට මාත්‍රාවෘද්ධිව බොන ශබ්දයා කෙරෙන් පරව එවිභක්තිව යකාරාගමව පිලිපෙරළිව ගාත්‍රාරූඪව මීබොනුයේ යනවාක්‍යයෙහි විභක්ති හට ලොප්ව නම්වත්ව ගාත්‍රාක්ෂරය හට ලොප්ව වනපෙරළි පිලිපෙරළි කළකල්හිමීපා, යනුවේ.

පන ශබ්දයා කෙරෙන් පරව යකාරාගමව බොනුයේ යන වාක්‍යයහට අප්‍රයොගව ප්‍රකෘතිවත්ව නම්වත්ව නකාර ලොප්ව වනපෙරළි පිලිපෙරළි

කළකල්හි පිනිපා, යනුවේ.

නි ශබ්දයා කෙරෙන් පරව කරණ්‍යෙ යනවා ක්‍යය හට අප්‍රයොගව යකාරාගමව වනපෙරළි පිළ්පෙරළි කොට නම්වත් කළකල්හි නිසයුරු, යනුවේ.

මෙසේමකොට හිරඅවුරණ්‍යෙ යනවාක්‍යයෙහි පූර්වප්‍රාණාක්ෂරයහට ලොප්ව හිරවරණ, යනුවේ.

මේආදිය කම්විභක්ති සමාසනම්වේ.

පරපුවූ යනතණ්හි පර ශබ්දයාකෙරෙන් පරව තෘතියා එකවචන අවිභක්තිව පූර්ව ප්‍රාණාක්ෂරයහට ලොප්ව ගාත්‍රාරූඪව විසිත්යන වාක්‍යව පුවූශබ්දයාකෙරෙන් පරව ප්‍රථමාවිභක්තිව සඳරුත්යනාදි අඩගසූත්‍රයෙන් යකාරාගමව ගාත්‍රාරූඪව පරාවිසින් පුවූයේ යනවාක්‍යයෙහි විහිත්යනා අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිවත්ව පරපුවූ, යනුවේ.

බඹ ශබ්දයාකෙරෙන් පරව හූ විභක්ති ලොප්ව ප්‍රකෘතිවත්ව නම්වත්ව පිළිපෙරළි වනපෙරළි කොට බඹදත්, යනුවේ.

මෙසේම කොට දෙව්හු විසින් දෙනලද්දෙ යන වාක්‍යයෙහි දෙව්දත්, යනුවේ.

මේආදිය කර්තෘවිභක්ති සමාසනම්වේ.

බමර ශබ්දයා කෙරෙන් පරව කරණ විභක්ති ලොප්ව කරනෙන් යන වාක්‍යව උදුල ශබ්දයා කෙරෙන් පරව ඒවිභක්තිව බමරකරනෙන් යන වාක්‍යයෙහි අප්‍රයොගිව විභක්තිලොප්ව ප්‍රකෘතිවත්ව නම්වත්ව ගාත්‍රාරූඪ කල කල්හි බමරුදුල, යනුවේ.

අත් ශබ්දයා කෙරෙන් පරව කරනෙන්යනා වාක්‍යව කම්ශබ්දයාගේ විභක්තිහටලොප්ව වාක්‍ය අප්‍රයොගව ප්‍රකෘතිවත්ව කම් ශබ්දයාගේ කකාරය

හට සඳරුත් යනාදීන් වනපෙරළිව අත්තම්, යනුවේ—

බා ශබ්දයාකෙරෙන් පරව කරණෙන් යන්නක්ව සූරු ශබ්දයා කෙරෙන් ඒවිභක්තිව වකාරයකාරාගමකොට පිලිපෙරළි කළකල්හි බාකරණෙන් කියාතිබෙයි වාක්‍යයහට අප්‍රයොගීව විභක්තිලොප්ව ප්‍රකෘතිවත්ව නම්වත්ව බාසූරු, යනුවේ—

කැස ශබ්දයාකෙරෙන් පරව ඉන්විභක්තිව පැමිනබොන ශබ්දයා කෙරෙන් පරව ඒ විභක්තිව යකාරාගම කොට පිලිපෙරළිව පැමිනි කැසින්බොනුයේ යනවාක්‍යයෙහි විභක්තිලොප්ව ප්‍රකෘතිවත්ව පිලිපෙරළිව කැසුබු, යනුවේ—

දියෙන් හැනූ බත් යන වාක්‍යයෙහි වාක්‍යය හට අප්‍රයොගීව විභක්ති ලොප්ව මාත්‍රා වෘඩ්ව දීබත්, යනුවේ—

මෙසේම කොට කිරින්පිසූබත් යන වාක්‍යයෙහි කිරිබත්, යනුවේ—

මේ ආදිය කරණ විභක්ති සමාසනම්වේ—

බමුණුදත් යනතණ්හි බමණ ශබ්දයා කෙරෙන් පරව අත්ට විභක්තිව දියයුතු යන වාක්‍යව දත් ශබ්දව වාක්‍යය හට අප්‍රයොගීව විභක්ති ලොප්ව ප්‍රකෘතිවත්ව නම්වත්ව බමුණුදත්, යනුවේ—

සිවුරුපිලි යනතණ්හි පිණිස පිරිනැමූ යන වාක්‍යයහට අප්‍රයොගීව සිවුරුපිලි, යනුවේ—

මේ ආදිය සම්ප්‍රදාන විභක්ති සමාසනම්වේ—

සොර ශබ්දයාකෙරෙන් පරව උගෙන් විභක්තිව බිය යන වාක්‍යව අප්‍රයොගීව ප්‍රකෘතිවත්ව නම්වත්ව සොරබිය, යනුවේ—

මිණියෙන් මූතු යන වාක්‍යයෙහි මිණිමූතු, යනුවේ—

රඝු ශබ්දයාකෙරෙන් පරව කෙරෙන් යන වාක්‍යයහට අප්‍රයොගීව් රඝුමුත්, යනුවේ—

මේආදිය අවදි විභක්ති සමාස නම්වේ.

රජපිරිස් යනතණ්හි රජශබ්දයාකෙරෙන් පරව හුගේ විභක්තිව ලොප්ව රජපිරිස්, යනුවේ—

බුදුගුණ යනතණ්හි උන්ගේ විභක්තිව ලොප්ව් බුදුගුණ, යනුවේ—

රියගිම් යනතණ්හි අගේ විභක්තිව ලොප්ව රිය ගිම්, යනුවේ—

සුරසතුරු යන වාක්‍යයෙහි නට විභක්තිලොප්ව සුරසතුරු, යනුවේ—

මේආදිය සම්බන්ධ විභක්ති සමාස නම්වේ—

උරදෘ යනතණ්හි උර ශබ්දයා කෙරෙන් පරව බජනූයේ පෙරවිබත් යනාදින් එහි විභක්තිව උරෙහිදෘ යන වාක්‍යයෙහි විභක්ති ලොප්ව උරදෘ යනුවේ—

දහම්හි සොඬ යන වාක්‍යයෙහි විභක්ති ලොප් කොට දහම්සොඬ යනුවේ—

නැලි ශබ්දයා කෙරෙන් පරව ඒ විභක්තිව යකාරාගම කොට නැලිශබ්ද මධ්‍යයෙහි රකාරයෙක් ආගමකොට පිලිපෙරළිව තෙල් ශබ්දයාගේ විභක්තිහට ලොප්ව නම්වත්ව නෙරළුයෙ තෙල් යන වාක්‍යයෙහි නැලිතෙල්, යනුවේ—

සරකුල්හි යන වාක්‍යයහට අප්‍රයොගීව සරුසඳ, යනුවේ—

මේ ආදිය ආධාර විභක්ති සමාස නම්වේ—

අතැ ශබ්දයාගෙ විභක්ති ලොප් නොකොට අතැවසනූයේ යන වාක්‍ය යෙහි අතැවැසි, යනුවේ—

මේ විභක්ති සමාස නම්වේ—.

නිඋපුල් යනතැන්හි නිල් ශබ්දයා කෙරෙන් පරව ඒ විභක්තිව යකාරාගමකොට ගාත්‍රාරූඪව වකාරාගමකොට පිළිපෙරළිව මාත්‍රා වැඩිව ද යන නිපාතයාගෙ විභක්ති ලොප්කොට එම යන වාක්‍යව උපුල් ශබ්දයා කෙරෙන් පරව ඒ විභක්තිව යකාරාගමකොට වකාරාගමයාට පිළිපෙරළිව මාත්‍රා වැඩිව ද යන නිපාතව නිල්වූයේද එම උපුල්වූයේ ද යන වාක්‍යයෙහි විජාතිය වස්තුයෙන් තොරවූ ස්වකීය ජාති ඇති වස්තුවට විශෙෂණකොට ශබ්දයා සම්බන්ධකරණු ලැබේද එකල්හි ඒ සමාසය සදරුත් විදිසියල් අනුරුසෙ පියොනත් යන අඩග සූත්‍රයෙන් සමාස වෙයි ඔහට එම සූත්‍රයෙන්ම විශෙෂණ සමාස සංඥද වේ

උක්තාර්ථවූ වාක්‍යයන්ට සදරුත් යනාදීන් අප්‍රයොගීව විභක්ති ලොප්ව ප්‍රකෘතිවත්ව නම්වත්ව ගාත්‍රාරූඪව නිඋපුල්, යනුවේ

හෙලිලි ශබ්දයා කෙරෙන් පරව වීත් යන නිපාතව ඹම යන වාක්‍යව අඹුශබ්දයත් මෙසේමකොට හෙලිලිවීත් ඹම අඹුවීත් යනතැන්හි වාක්‍ය අප්‍රයොගීව විභක්ති ලොප්ව ප්‍රකෘතිවත්ව නම්වත්ව ලකාර විත්ත්වව ගාත්‍රාරූඪව හෙලිල්ලඹු, යනුවේ

සිහඑව් යන තැන්හි සිණ්හයක්හු මෙන් නුසි යන අර්ථයෙහි වාක්‍යයහට අප්‍රයොගීව සිහ යනුවේ

නර ශබ්දයාකෙරෙන් පරව ඒ විභක්තිව යකාරාගමව පමුනුවා වකාරාගමව පිළිපෙරළිව ද යන නිපාතව එම යන වාක්‍යව සිහ ශබ්දයා කෙරෙන් පරව එසේම කොට නර වූයේද එම සිහවූයෙද යන වාක්‍යයෙහි අප්‍රයොගීව විභක්ති ලොප්ව ප්‍රකෘතිවත්ව නරසී, යනුවේ

ලියකොමල යනතැන්හි ලිය ශබ්දයා කෙරෙන් පරවූ එව් යන වාක්‍යව කොමල ශබ්දව ලියඑව්

කොමල සනතණ්හි වාක්‍යයහට අප්‍රයොගීව නම් වනව ලියණ්කොමල, යනුවේ.

සරණමසරා සනතණ්හි වාක්‍යයහට අප්‍රයොගීව සරණසරා, යනුවේ.

එකද එම විරුද යන වාක්‍යයෙහි අප්‍රයොගීව එකවිරු යනුවේ.

ලො ශබ්දයාකෙරෙන් පරව හූ විභක්තිව වකාරාගමකොට ලකාර වකාරයන්ට පිළිපෙරළිව ලෙව්හූ දෙදෙනෙක් එක්කොට සලකනලද හූ යන වාක්‍යයෙහි දෙශබ්දයා සම්බන්ධවූ වාක්‍යය හට අප්‍රයොගීව විභක්ති ලොප්ව ප්‍රකෘතිවත්ව පද පෙරළිව දෙලො, යනුවේ.

මෙසේම වාක්‍යයහට අප්‍රයොගීව පදපෙරළිව තෙසරණ- සිව්සයුරු- පස්මහගඟ- සත්කුලපව්- අටනාකුල- නවදෙර- දසරජදම්—යනුවේ.

මේ විශෙෂණ සමාස නම්වේ.

එරුණුහස් යන තණ්හි හස් ශබ්දයාගේ අකාරද විභක්තිද ලොප්කොට එරුණු ශබ්දයාකෙරෙන් අවිභක්ති ලොප්කොට පිළිපෙරළිව යමකටද යන වාක්‍යව හස්එරුනෙන් යමකටැ යනවාක්‍යයෙහි ප්‍රථමාන්ත නොවනනාවූ අන්‍ය පදාර්ථයෙහි නාමයො දෙදෙනෙක් හෝ බොහෝ දෙනෙක් හෝ යම් කලෙක්හි සමාස කරණු ලැබෙද්ද එකල්හි ඒ සමාසය සඳරුත් යනාදින් අන්‍යාර්ථ සමාසවෙයි වූතනාද්වූ වාක්‍යයහට එම සූත්‍රයෙන් අප්‍රයොගීව විභක්ති ලොප්ව ප්‍රකෘතිවත්ව සඳරුත් යනාදින්ම පදපෙරළි කළකල්හි එරුණුහස් යනුවේ.

දම ශබ්දයා කෙරෙන් පරව අවිභක්තිව නකාරාගමව විභක්ති ලොප්ව ලද යන වාක්‍යව ඉඳුරු ශබ්දයාට පිළිපෙරළිව යමක්හු විසින්ද යන වාක්‍යව අප්‍රයොගීව විභක්ති ලොප්ව ප්‍රකෘතිවාව මාත්‍රා වෘ

ඩ්ව පිලිපෙරළිව දැමිදුරු, යනුවේ—

යම්කුරුණෙන් බත්සුන් යන අර්ථයෙහි වාක්‍යය හට අප්‍රයොගීව පදපෙරළිව සුත්බත්, යනුවේ.

යම් කරුණෙන් තුරුසුන් යන වාක්‍යයහට අප්‍රයොගීව පදපෙරළිව සුත්තුරු යනුවේ—

දෙනලදවත් යමක් හටද යන වාක්‍යයෙහි අප්‍රයොගීව ප්‍රකෘතිවත්‍ව නම්වත්‍ව දූත්වත්, යනුවේ.

ගිලිනුනු ගොනගුල් යමකින් යනතණ්හි වාක්‍යයහට අප්‍රයොගීව ප්‍රකෘතිවත්‍ව නම්වත්‍ව ගුළුගොනගුල්, යනුවේ—

සඳවත් වත් ඇත්නී යනතණ්හි වාක්‍යයහට අප්‍රයොගීව නම්වත්‍ව සඳවත් වත්, යනුවේ—

මෙසේම වාක්‍යය හට අප්‍රයොගීව සිඟුවලඟ, යනුවේ—

ඇතියෙ යන වාක්‍යයහට අප්‍රයොගීව දසබල යනුවේ—

පස්ඇස් යනුද මෙසේමැයි—

මත් ශබ්දයා කෙරෙන් පරව නේ යන සර්වනාමව ගජ ශබ්දයා කෙරෙත් පරව අත් විභක්තිව ඇතියෙ යන වාක්‍යව අප්‍රයොගීව නම්වත්‍ව මත්නේ ගජන්, යනුවේ—

ඇතියෙ යන වක්‍යයහට අප්‍රයොගීව නම්වත්‍ව නත්සුරුවිරුබලත්, යනුවේ—

තරුවැල සහවූයේ යනතණ්හි වාක්‍යයහට අප්‍රයොගීව පද විපර්‍යාසව සහතරුවැල, යනුවේ—

සමළුඳර ඇතියේ යනතණ්හි වාක්‍යයහට අප්‍රයොගව දකාර ලොප්ව වකාරයෙක් ආගමකොට වනපෙරළි පිලිපෙරළි විබත්පෙරළිව සොහොවුරු, යනුවේ—

ඇතියේ යන වාක්‍යයන් අප්‍රයොගකොට ලඹසවන්, යනුවේ—

ලඹසවන් යනාදිය තත්ගුණ නම්වේ.

මෙසේම කොට ඉකුත්සපුරු, යනුවේ.

ඉකුත්සපුරු යනාදිය අතත්ගුණ නම්වේ.

මේ අන්‍යාර්ථ සමාසනාම් වේ.

හිරසඳ යනතැන්හි හිර ශබ්දයා කෙරෙන් පරව ප්‍රථමා අවිභක්තිව පූර්වස්වර ලෝප්ව පැමින ද යන නිපාතයා කෙරෙන් පරව අවිභක්තිව පැමිනසඳ ශබ්දද මෙසේම කොට හිරද සඳද යන වාක්‍යයෙහි අවයවාර්ථයක් හෝ සමුදායාර්ථයක් හෝ ප්‍රමුඛවූ කල්හි දකාරාර්ථයෙහිවූ නාම පදයන්හා යම් කලෙක්හි සමාස කරණු ලැබෙද්ද එකල්හි ඒ සමාසය සඳරුත් විදිසියල් යනාදී සූත්‍රරෙන් සමාසවෙයි එම සූත්‍රරෙන්ම ඕහට සමාස සංඥාවේ වූකතාර්ථ වූ වාක්‍යයන්ට අප්‍රයොගව ප්‍රකෘතිවත්ව නාම්වත්ව හිරසඳ, යනුවේ.

මෙසේම කොට සැරියුත් මහමුගලන්, යනුවේ.

හු විභක්ත්ව විකල්පයෙන් ලොප්ව ද යන නිපාතව වාක්‍යයහට අප්‍රයොගව විභක්ති ලොප්ව ප්‍රකෘතිවත්ව නාම්වත්ව ඇත් අස් රිය පද යනුවේ.

බහුවාර්ථයෙහි බඹ සුර නරෝ, යනුවේ.

ඒකවචනයෙහි ගී නැටුම්, යනුවේ.

මේ දකාරාර්ථ සමාස නාම්වේ.

සමාස කාණ්ඩය නිමි.

---

පරිසමාප්තවූයේ අතීතනාම්වෙ නොනිමියෙ වර්තමානනාම්වෙ නොපැමිණියෙ අනාගතනාම්වේ—

යමාඉඳුනු කෙලේ යනතැන්හි, කර කරනාය නධාතු කරකියාවෙ කරයනධාතුහුගෙ ප්‍රාණාක්ෂරයහට සඳරුත්යනාදින් ලොප්ව ඔහුකෙරෙණ්

පරව භූතාර්‍ථයෙහි අන්‍යකාර කෙක වචනයෙහි, ඒ ඉ ඊ උ ද, යනාදි සූත්‍රයෙන් ඒ ප්‍රත්‍යයවේ ප්‍රත්‍යයා පරකල්හි කරයන ධාතූහුගෙ රකාරය හට සදරුත් යනාදින් ළකාරයෙක් ආදේසවේ සදරුත් යනාදින්ම ඒ ප්‍රත්‍යයා ගාත්‍රාරූඪකොට පිළිපෙරළි කළකල්හි කෙළේ යනුවේ—

තුසතිසීමෙහි යනධාතු තුසකියා තිබෙයි ධාතූහුගෙසවර ලොප්ව ඔහුකෙරෙන් පරව භූතාර්‍ථයෙහි, ඒ ඉ ඊ උ ද, යනාදි සූත්‍රයෙන් ඉ ප්‍රත්‍යයවේ ඉ ප්‍රත්‍යයා පරකල්හි ධාත්වන්තවූ සකාරයහට ටකාරාදේසව පිළිපෙරළි කළකල්හිතිටියනුවේ—

විපූර්වවූ නසනොදිසුම්හි යනධාතු නසකියා තිබෙසී ඔහුකෙරෙන් පරව භූතාර්‍ථයෙහි, ඒ ඉ ඊ උ ද, යනාදි, සූත්‍රයෙන් ඊ ප්‍රත්‍යයවෙ සදරුත් යනාදින් සකාරයහට හකාරොච්චාරණයකොට පිළිපෙරළිව වැනහී; යනුවේ—

කුමුදු ගැලීමෙහියන ධාතූහුකෙරෙන් පරව භූතාර්‍ථයෙහි, ඒ ඉ ඊ උ ද, යනාදි සූත්‍රයෙන් උප්‍රත්‍යය කොට දකාරයාට ඩකාරා දෙසකොට කුමුඩු, යනුවේ—

මේඅන්‍යකාරක ඒකාර්‍ථයෙහිවූ අතීත ප්‍රත්‍යයයි.

පවතියන තණ්හි ප පූර්වවූ වතවැටීමෙහි යන ධාතු වතකියාවේ ඔහුකෙරෙන් පරව අන්‍යකාර කෙක වචනයෙහි, ඒ ඉ ඊ උ ද, යනාදිසූත්‍රයෙන් ඉ ප්‍රත්‍යයවෙයි සදරුත් යනාදි අඩග සූත්‍රයෙන් ගාත්‍රාරූඪව පවතී යනුවේ—

පාපීමෙහි යනධාතු පාකියාවෙයි ඔහුකෙරෙන් පරව අතීතාර්‍ථයෙහි බප්‍රත්‍යයව වනපෙරළි කොටබො, යනුවේ—

දනාදිනීමෙහි යනධාතු දනකියාවෙයි ඔහුකෙරෙන් පරව වර්‍තමානාර්‍ථයෙහි ඒ ප්‍රත්‍යයව පිළිපෙරළිව දෙනෙ, යනුවේ—

පුද, පිදිමෙහියන ධාතුකෙරෙත් පරව වර්තමා
නාර්ථයෙහි, ඒ ඉ ඊ උ ද, යනාදී සූත්‍රයෙන්-අ-ප්‍ර
ත්‍යයව පූර්වස්වර ලොප්ව ගාත්‍රාරූඪ කොටපුදූ
යනුවේ—

මේ අන්‍යකාරක ඒකාර්ථයෙහිවූ වර්තමාන ප්‍රත්‍යයයි

දන, දිනීමෙහියන ධාතුහුකෙරෙන් පරව අනා
ගතාර්ථ අන්‍යකාරකෛක වචනයෙහි ඒ ඉ ඊ උ ද
යනාදී සූත්‍රයෙන් අන්නේ ප්‍රත්‍යයව සදරුත් යනා
දීන් ගාත්‍රාරූඪ කළකල්හී දනන්නේ යනුවේ—

දෑ-දීමෙහියන ධාතුහුකෙරෙන් පරව-එනෙන-
ප්‍රත්‍යයව එකාරයා ගාත්‍රාරූඪකළ කල්හි-දනන්
නේ-යනුවේ—

දෑ-දීමෙහියනධාතුහු කෙරෙන් පරව අනාගතා
ර්ථයෙහි-එන්නේ-ප්‍රත්‍යයව පූර්වස්වර ලොප්ව ගා
ත්‍රාරූඪකළකල්හි-දෙන්නේ-යනුවේ—

පා-පීමෙහි යනධාතු පාකියාවෙ ඔහුකෙරෙන්
පරව අනාගතාර්ථයෙහි-ඔන්නේ-ප්‍රත්‍යයකොට—
සදරුත් යනාදී සූත්‍රෙරෙන් පකාරයාට බකාරෙරුච්
චාරණය කළකල්හි-බොන්නේ-යනුවේ—

වස-විසීමෙහියන ධාතුකෙරෙන් පරව අනාග
තාර්ථයෙහි-නේ-ප්‍රත්‍යයව ඔහුපරකල්හි පූර්ව ප්‍රා
ණාක්ෂරයා ලොප්කොට-වස්නේ-යනුවේ—

මේඅන්‍ය කාරක ඒකාර්ථයෙහිවූ අනාගත ප්‍රත්‍යයයි

ගෙත්, ගෙනීමෙහියන ධාතුහු කෙරෙන් පරව
අනාගතාර්ථ අන්‍යකාරක බහුවචනයෙහි, හහු යූ
තු වියූතු යනාදී සූත්‍රයෙන් ඌ ප්‍රත්‍යයකොට සද
රුත් යනාදීන් ඌ ප්‍රත්‍යයා ගාත්‍රාරූඪ කළකල්හි
ගෙතූ යනුවේ—

මෙම ගෙත්යන ධාතුහු කෙරෙන් පරව අතී
තාර්ථයෙහි හහුයූතු වියූතු යනාදී සූත්‍රයෙන් හ
යන්නක් හුයන්නක් යුක්තවූ ඌ ප්‍රත්‍යයකොට ගා
ත්‍රාරූඪව ගෙතූහ ගෙතූහු යනුවේ—

කර කිරීමෙහියන ධාතු කරකියාතිබෙයි ඔහු කෙරෙන් පරව හඟුයුතු වියුතු යනාදින් ඔ ප්‍රත්‍ය ප්‍රත්‍යහු ප්‍රත්‍යයන්කොට බත්වනතයන්ව සඳරුත් යනාදින් ළකාරොච්චාරණය කළකල්හි කළො කළහ කළහු යනුවේ

උපූර්වවූ ගතගතෙහි යනධාතු ගතකියාවේ ඔ හුකෙරෙන් පරව අතීතාර්ථයෙහි උ ප්‍රත්‍යයද උ ප්‍රත්‍යයා වියුක්ත, හ ප්‍රත්‍යය හු ප්‍රත්‍යයන්ව සඳරුත් යනාදින් වනපෙරළිද විකල්පයෙන් විත්වරූපව ගාත්‍රාරූඪකොට උගත්තු උගත්හ උගත්හු යනු වේ

බිඳ බිඳීමෙහි යනධාතු බිඳකියාවෙයි ඔහුකෙ රෙන් පරව උන් ප්‍රත්‍යයා හයනුද හුයනුදකොට ප්‍රත්‍යයන් පරකල්හි දකාර ලොප්කොට පිළි පෙරළිව පූර්වස්වර ලොප්ව ගත්‍රාරූඪකොට බූන් බූන්හ බූන්හු යනුවේ

මේ අන්‍යකාරක බහුවාර්ථයෙහිවූ අතීත ප්‍රත්‍යයයි

වන, වැනීමෙහි යනධාතු වනකියා තිබෙයි එහුකෙරෙන් පරව වර්තමානාර්ථ අන්‍යකාරක බහු වාර්ථයෙහි හහුයුතු යනාදි සූත්‍රෙන් අත් ප්‍රත්‍ය යව පූර්වාස්වර ලොප්ව ගාත්‍රාරූඪ කළකල්හි ව නත් යනුවේ

විඳ විඳීමෙහි යනධාතු විඳකියාවෙයි ඔහුකෙ රෙන් පරව වර්තමානාර්ථ අන්‍යකාරක බහුවචන යෙහි ඉත් ප්‍රත්‍යයව විඳිත් යනුවේ

දා දීමෙහි යනධාතු දාකියාවේ ඔහුකෙරෙන් ප රව වර්තමානාර්ථයෙහි එත් ප්‍රත්‍යයව පැමිනාවූ කල් හි දෙත් යනුවේ

පා පීමෙහියන ධාතු පා කියාතිබෙයි ඔහුකෙරෙන් පරව වර්තමානාර්ථයෙහි ඔත් ප්‍රත්‍යයව පකාරයාට බකාරාදේසකොට පැමිණ බොත් යනුවේ

ය ලයනාන හෙතුකොටගෙන ඉගනාකක් යුකත

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල

වූ ප්‍රත්‍යය අභිමතයි මෙහි දිති විදිති දෙති බො
ති යනාදිය සිද්ධයි—

### මේ අන්‍යකාරක බහ්වාර්ථයෙහි වර්තමාන ප්‍රත්‍යයයි

පූද පිදිමෙහියනධාතු පූදකියාතිබෙයි ඔහුකෙ
රෙන්පරව අනාගතාර්ථයෙහි අන්‍යකාරක බහු
වචනයෙහි හනුයුතු යනාදි සූත්‍රයෙන් අනෙනා
ප්‍රත්‍යයෙව් සදරුත්යනාදි සූත්‍රයෙන් පූර්වස්වර ලො
ප්කොට පරස්වරයා ගාත්‍රාරූඪකොට සිද්ධකළකල්
හි, පූදනෙනා යනුවේ—

වූ වීමෙහියනධාතුවූ කියාවෙ ඔහුකෙරෙන් ප
රව අනාගතාර්ථයෙහි අනනාහු ප්‍රත්‍යයවෙයි ගා
ත්‍රාරූඪකළකල්හි වනනාහු යනුවේ—

නොයනු පූර්වකොටඇති දස දැක්මෙහියනධා
තු දසකියාවෙයි ඔහුකෙරෙන් පරව අන්‍යකාරක
බහුවචනයෙහි නාහු ප්‍රත්‍යයකොට සකාරයහට
කකාරා දේසකළකල්හි නොදක්නාහුය යනුවේ.

දකාර හේතුකොටගෙන උකාරයා වියුක්තද
වේ මෙහි අනනාහානාහා ප්‍රත්‍යයවේ වනනාහා
නොදක්නාහා, යනාදිය සිද්ධයි—

### මේ අන්‍යකාරක බහ්වාර්ථයෙහි අනාගත ප්‍රත්‍යයයි

කරකිරීමෙහියන ධාතුහුකෙරෙන් පරව අතීතා
ර්ථයෙහි අන්‍යකාරකෙක බහුවචනයෙහි, තසද
කරු අරුතැ, නෙසූත්‍රයෙන් හියනනාක් යුක්තවූ එ,
ප්‍රත්‍යයෙක්ද හුයනනකින් යුක්තවූ ආ ප්‍රත්‍යයෙක්
දවෙයි ප්‍රත්‍යයන් පරකල්හි ධාත්වන්තයහට, සද
රුත්, යනාදින් ළකාරාදේසව පූර්වස්වර ලොප්ව
විකල්පයෙන් පිලිපෙරළිව් ගාත්‍රාරූඪව කෙළෙහි
කළාහු, යනුවේ

මෙසේම කරයන ධාතුකෙරෙන් පරව වර්තමා
නාර්ථයෙහි ත ශබ්දකාරකෙක බහුවචනයෙහි,
තසදකරු අරුතැ, යනාදින් එකාර අකායන් යුක්ත
වූ හියනු හුයනු යනප්‍රත්‍යයව විකල්පයෙන් පිලි

පෙරළි කළකල්හි කෙරෙහි, කරණු, යනුවේ—

කර, යනධාතුහු කෙරෙන් පරව අනාගතාර්‍ථ ඒකවචනයෙහිද බහුවචනයෙහිද, තසදකරු අරුතයන සූත්‍රයෙන් අනෙනහි ප්‍රත්‍යයහා අනනහු ප්‍රත්‍යයව පූර්‍වස්වර ලොප්ව පරස්වර ගාත්‍රාරූඪකළකල්හි කරණෙණහි කරණෙණහු යනුවේ—

මේතශබ්ද සම්බන්ධවූ ත්‍රෛකාලික ක්‍රියාවයි

බජ, සෙව්මෙහියන ධාතුකෙරෙන් පරව අතීතාර්‍ථයෙහි ම ශබ්දකාරක ඒකවචන යෙහිද බහුවචනයෙහිද, තසදකරු අරුත, යනසූත්‍රයෙන් ඉම්, ඉමි; උමු, උමො, උම්හ, උම්හු, යනමේ ප්‍රත්‍යයන්ව සදරුත් යනාදී සූත්‍රයෙන් පූර්‍වශ්වර ලොප්ව පිළිපෙරළිව ගාත්‍රාරූඪ කළකල්හි බිජිම්, බිජිමි, බිජුමු, බිජුමො, බිජුම්හ, බිජුම්හු, යනුවේ—

බජ, සෙව්මෙහියන ධාතු බජ, කියාවේ ඔහු කෙරෙන්පරව අතීතාර්‍ථ-ම ශබ්දකාරක ඒකවචන යෙහිද, බහුවචනයෙහිද, තසදකරු අරුත, යන සූත්‍රයෙන්, එමි· එම්, අමු, අමො, අම්හ, අම්හු, යන මේ ප්‍රත්‍යයන්ව ස්වර ලොප්ව පිළිපෙරළිව ගාත්‍රා රූඪව බෙජෙමි, බෙජෙම්, බජමු, බජම්හ, බජම්හු' යනුවේ—

බජ, සෙව්මෙහියන ධාතුහුකෙරෙන් පරව අනාගතාර්‍ථ මශබ්දකාරක ඒකවචනයෙහිද, බහුවච නයෙහිද, තසදකරු අරුතයන සූත්‍රයෙන්, අනෙන ම්, අනනාමු, අනනාමො, යන ප්‍රත්‍යයන්ව ස්වර ලොපයකොට පමුනුවා, බජනෙනම්, බජනනාමු, බජ නනාමො, යනුවේ—

ව්‍යවහාර යෙදෙන පරිච්ඡේදන් ප්‍රත්‍යය යොජනා යකරණු—

මේමශබ්දකාරක සම්බන්ධවූ ත්‍රෛකාලික ක්‍රියාවයි

රජකරන්නේ යනතැණ්හි, කර, කිරීමෙහි යන ධාතුහු කෙරෙන් අර්‍ථක්‍රියා වාච්‍යශබ්දයක් කිව

මනාකල්හි සදරුත්යනාදී අඩගසූත්‍රයෙන් අන්‍යා ප්‍රත්‍යයකොට පූර්වස්වර ලොප්ව කරන්නාශබ්දයා නිපදවා ප්‍රථමා ඒකවචන ඒ විභක්ති කළකල්හි කරන්නෙන් යනුවේ

වෙලපත්ති, යනතන්හි විප්‍රූව්වූ ලප වෙහෙසීමෙහියන ධාතුනුකෙරෙන් පරවඅතීක්‍රියා වචීශබ්දයක් කියමනාකල්හි, සදරුත්, යනාදි සූත්‍රයෙන් අන්න, ප්‍රත්‍යයකොට ස්ත්‍රීලිඟු ඊප්‍රත්‍යයකොට පිලිපෙරැලිව අකාර ලොප්ව වෙලපත්ති, යනුවේ

මායවූසූයනතණ්හි වස, වැසීවෙහියන ධාතුහුකෙරෙන් පරව අතීක්‍රියා වාචීශබ්දයක් කිවමනාකල්හි කාලාපේක්‍ෂානොකොට සදරුත්යනාදී සූත්‍රයෙන් ස්ත්‍රීලිඟුයෙහි උප්‍රත්‍යයකොට පිලිපෙරැලිකළකල්හි වූ සූයනුවේ

පසේබුදුවනුයේ, යනතණ්හි වූ වීමෙහි යනධාතුහුකෙරෙන් අතීක්‍රියා වාචීශබ්දයක් කිවමනාකල්හි කාලාපේක්‍ෂා නොකොට සදරුත්යනාදී සූත්‍රයෙන් නු ප්‍රත්‍යයකොට ලිඟුවත්කොට ප්‍රථමාඑකවචන විභක්තිකොට මාත්‍රාවෘද්ධිකොට මධ්‍යයෙයකාරාගමකොට ධාතුහුගේ උකාරයාට අකාරාදේසකළකල්හි පසේබුදුවනු යනුවේ

රහත්පල බජන්ති, යනතණ්හි බජ, සෙවීමෙහි යනධාතුහු කෙරෙන් අතීක්‍රියා වාචීශබ්දයක් කිවමනාකල්හි සදරුත්යනාදී සූත්‍රයෙන් අන්‍යාප්‍රත්‍යයකොට ස්ත්‍රීලිඟුයෙහි ඊප්‍රත්‍යයකළ කල්හි බජන්ති යනුවේ

ත්‍රෛකාලික ක්‍රියාවද අසම්භාවනා ක්‍රියාවද

අවබෝධ කරණු

මතුකියන් විධියෙහි, අප්‍රත්‍යද, එ, ප්‍රත්‍යයද, අන්න, ප්‍රත්‍යයද අවු, ප්‍රත්‍යයද. උ, ප්‍රත්‍යයද, අභිමතයි

එහි—බජසෙවීමෙහියන ධාතුහුකෙරෙන් පරව අප්‍රත්‍යව පිලිපෙරලිව බොජ, යනුවේ—

දී, පනසැරීමෙහි යන ධාතුහු කෙරෙන් පරව විධි ක්‍රියාකලකල්හි සැරදේ යනුවේ—

පිස, යනධාතුහුකෙරෙන් පරව අනෙන, ප්‍රත්‍යයකලකල්හි පිසන්නේ යනුවේ—

දෙස, දෙසීමෙහියන ධාතුහුකෙරෙන් පරව, සදරුත්, යනාදී සූත්‍රයෙන්, අන්නෑ, ප්‍රත්‍යකලකල්හි දෙසන්නෑ, යනුවේ—

බජ, සෙවීමෙහි යන ධාතුහු කෙරෙන් පරව, සදරුත්යනාදී සූත්‍රයෙන්, අවූ, ප්‍රත්‍යයකළ කල්හි බජව, යනුවේ—

දස, බැල්මෙහියනධාතු දසකියාවේ ඔහට සදරුත්යනාදී සූත්‍රයෙන්, උ, ප්‍රත්‍යකොට කකාරදේසව විතනකලකල්හි, දක්කු, යනුවෙ—

මේවිධි ක්‍රියායි—

අනාගත ප්‍රාර්ථනාකිරිම ආශිර්වාදනම්වේ—

එහි, ඉස්බඅදත් දුරුකිරීමෙහි යනධාතු ඉස්බකියාවේ ඔහුකෙරෙන් පරව ඒ ප්‍රත්‍යයව ප්‍රත්‍යයාකෙරෙන් පරව වාප්‍රත්‍යයව ඉස්බෙවා, යනුවේ

විජූවිවූජඹ, ගත් නැමීමෙහියනධාතු ජඹකියාවෙ ඔහුකෙරෙන් පරව, ඒ ප්‍රත්‍යයව මාත්‍රාවෑඩිව වාප්‍රත්‍යයව වැජඹෙවා, යනුවේ—

වූ, වීමෙහියන ධාතුවූ කියාවේ ඔහුකෙරෙන් පරව අම් ප්‍රත්‍යයව පිල්පෙරලිව වාප්‍රත්‍යයව වෙමවා, යනුවෙ—

මේආශිර්වාද ක්‍රියාවයි—

මේකියනලද සර්වක්‍රියා පදයන්හි කර්මාර්ථයට භාරව විවක්ෂකලහොත් කර්මප්‍රත්‍යය යෙදෙනපරිදෙන් කරණු—

අතීතකාලභේදයෙහි ධාතුප්‍රත්‍යයන් දෙදෙනාගෙ මධ්‍යයෙහි නප්‍රත්‍යයද පිලිවිපර්‍ය්‍යාසයද අනාගත වර්‍තමානභේදක්හි පිලිවිපර්‍ය්‍යාසයද මාත්‍රාවෘද්ධිද අභිමතයි—

දව, දැවීමෙහි—වස, මුවහ කිරීමෙහි—මව, නිපදවීමෙහි—මේආදිය පරීක්‍ෂාකරණු—

අර්‍ථවාචක අවස්ථාවෙහි ලබයනධාතු යොජනාය කරණු—

කර්තෘඅර්ථයට මේප්‍රත්‍යය අභිමතයි—

බැබලිනී, යනාදී ආකාරඇත්තේයි—බබල සොභෙනියන ධාතු බබලකියාවේ ඔහුකෙරෙන් පරව නිප්‍රත්‍යයව පිලිපෙරළි කළකල්හි බැබලිනි යනුවේ—

බිඳ, බිඳීමෙහියන ධාතු බිඳකියාවේ ඔහුකෙරෙන් පරව ඒ ප්‍රත්‍යයකළකල්හි බිඳේ යනුවේ—

සචකර්තෘ සචකර්මනම්වේ—

භොජ, යනධාතුහුකෙරෙන් පරව නුප්‍රත්‍යකොට බොජනු, යනුවේ—

සියළුතැන්හි යෙදෙන පර්‍යේදන් බහුවචන යොදනු—

තුන්කාලයෙහිද, ත්‍රිශබ්දයෙහිද රූපවෙන්නොව අතීතාර්ථයෙහිහෝ කාලාර්ථ යෙහිහෝ ක්‍රියාව අසම්භාවන නම්වෙයි—මෙහි, තප්‍රත්‍යය අභිමතයි—

යා, ගමන්හි යනධාතු යා, කියානීබෙයි ඔහුකෙරෙන් පරව තප්‍රත්‍යයව යා යනධාතුහුගේ ආකාරයහට හ්‍රස්වයතයනුවේ—

වන, වෑනීමෙහියන ධාතුහුකෙරෙන් පරව තප්‍රත්‍යයව වනාත, යනුවේ—

කර, කරණෙයන ධාතුහුකෙරෙන් පරව තප්‍රත්‍යයව කරත, යනුවේ—

මේආදී ආකාරඇත්තේයි—

නොපුව්වූසිත, සිතිමෙහියනධාතු සිතුකියාවේ ඔහුකෙරෙන් පරව ඉය ප්‍රත්‍යයව නොසිතිය, යනුවේ—

දස, දිසුම්හියනධාතු දසකියාවේ ඔහුකෙරෙන් පරව අප්‍රත්‍යයවේ සකාරයාහට කකාරාදේසව ඒතනකොට පූව්දකාරයාට පිළිපෙරළි කළකල්හි දැක්කායනුවේ—

කී, කීමෙහියනධාතු කී කියාවෙ ඔහුකෙරෙන් පරව වප්‍රත්‍යය කළකල්හි කිව, යනුවේ—

කර, කිරීමෙහි යන ධාතු කර කියාවෙ ඔහු කෙරෙන් පර අප්‍රත්‍යයව කර යනධාතුහුගෙ රකාරයහට ලකාර දේසකළකල්හි කළ, යනුවේ—

මේආදිය අසම්භාවන ක්‍රියාවෙහි අසිමතයි—

ව්‍යවහාරය යෙදෙන පරිදෙන් ප්‍රත්‍යය යෝජනය කරණු.

මේ අසම්භාවන ක්‍රියායි.

තර, පීනිමෙහියන ධාතුහුකෙරෙණ් පරව ඇප්‍රත්‍යයකොට මාත්‍රාවෘඩිකළකල්හි තැරූ, යනුවේ—

පූර, පිරීමෙහියන ධාතුහුකෙරණ් පරව ආ ප්‍රත්‍යයකළකල්හි පූරා, යනුවේ—

සක, සැකෙහියන ධාතුහු කෙරෙණ් පරව ඊ ප්‍රත්‍යයකළ කල්හි සැකී, යනුවේ—

ගම, යාමෙහි යන ධාතුහුකෙරෙණ් පරව ඉන් ප්‍රත්‍යයව මකාරයට සකාරාදේසහා ඔකාර ගම කළකල්හි ගොසින්, යනුවේ—

දස, දැකීමෙහියන ධාතුහුකෙරෙණ් පරව ඇලාප්‍රත්‍යයව දැකලා, යනුවේ—

පිරි, පූර්වීඉක්සා බැලීමෙහියන ධාතුහුකෙරෙණ් පරව ආලාප්‍රත්‍යයව පිළිපෙරළි කළකල්හි පිරික්

සාලා, යනුවේ—

පා, පීමෙහියන ධාතුහුකෙරෙණ් පරව ඊලා ප්‍රත්‍යයව බීලා, යනුවේ—

ගම්, යාමෙහියන ධාතුනුකෙරෙණ් පරව ඉන් ලාප්‍රත්‍යයව ගොසින්ලා, යනුවේ—

මේධාතු ප්‍රකෘතිවූ පරිදියි.

මුද, යනධාතු මුදකියාත්බෙයි ඔහුකෙරෙණ් පරව එකකතු කිරියනෙන් යනාදිසූත්‍රයෙන් අ ප්‍රත්‍යයකොට මුදකියාතිබෙයි ඔහුකෙරෙණ් පරව සඳරුත් යනාදි සූත්‍රයෙන් ගණප්‍රත්‍යයකළ කල්හි මුදගණී, යනුවේ—

ප්‍රත්‍යයසම්බන්ධවූ ත්‍රෛකාලික ක්‍රියාසිඬකටයුතු.

කී, කීමෙහියන ධාතුනුකෙරෙණ් පර පෙර පරිදෙන් අ ප්‍රත්‍යයකොට යකාරාගමකොට ඉකාරය ට මාත්‍රාහානිකොට කියායි, පූර්වක්‍රියා සිඬකොට ඔහුකෙරෙණ් පරව අන්තේ ප්‍රත්‍යයකොට ලකාරා ගමකළකල්හි කියාලන්තේ, යනුවේ—

පෙරපරිදෙන් ක්‍රියාපද සිඬකටයුතු—

මේපූර්වක්‍රියායි.

තන, තැනීමෙහියන ධාතුහු කෙරෙණ් පරව මින්ප්‍රත්‍යයව තනමින්, යනුවේ—

පිය, පියවීමෙහියන ධාතුහුකෙරෙණ් පරව මින ප්‍රත්‍යයව පියමින, යනුවේ—

මල, මැලෑමෙහි යන ධාතුහු කෙරෙණ් පරව මින් ප්‍රත්‍යයව යකාරාගම කළකල්හි දිලියෙමිනි, යනුවේ—

මේ මිශ්‍ර ක්‍රියායි.

විස්තර ව්‍යවහාරයෙන් පරීක්ෂාකරණු ක්‍රියාධිකාරනම්වූ සත්වැනි කාණ්ඩයයි.

### කර්තව්‍යදෙශ කරණීනම්වේ—

කර, යනධාතුහු කෙරෙණ් පරව ණී ප්‍රත්‍යය කළකල්හි කරණී, යනුවේ—

පා, යනධාතුහුකෙරණ් පරව ඇත්ප්‍රත්‍යයකොට සිඬකළකල්හි පැත්, යනුවේ—

බොජ, යනධාතුහු කෙරෙණ් පරව උත් ප්‍රත්‍යය කොට සිඬකළකල්හි බොජුත්, යනුවේ—

කඳ, යනධාතුහු කෙරෙණ් පරව උ ප්‍රත්‍යයකො ට සිඬකළකල්හි කඳු, යනුවේ—

ගත, යනධාතුහුකෙරෙණ් පරව අප්‍රත්‍යයකොට ස්වරලොප් ප්‍රකෘතිවත්කළකල්හි ගත්, යනුවේ—

දෘ, යන ධාතුනු කෙරෙන් පරව අන් ප්‍රත්‍යයකළ කල්හි දන්, යනුවේ—

මේආදිය කර්මකාරක ප්‍රත්‍යයෙන් නිෂ්පන්නයි.

### කරණතැනත්තේ කර්තෘනම්වේ.

එහි කර, යනධාතුහු කෙරණ් පරව උප්‍රත්‍යය කොට රකාරයාට තකාරාදේසකොට සිඬකළකල්හි කතු, යනුවේ—

ගණ, යන ධාතුහු කෙරෙණ් පරව ඉ ප්‍රත්‍යය කොට මාත්‍රාවෘඞ්ඪි කළකල්හි ගැණි, යනුවේ—

විද, යනධාතුහු කෙරෙණ් පරව ඉප්‍රත්‍යයකොට මාත්‍රාවෘඞ්ඪිකළ කල්හි වැදි, යනුවේ—

යද, යනධාතුහු කෙරෙන් පරව ඉප්‍රත්‍යයව මා ත්‍රාවෘඞ්ඪිකළකල්හි යැදි, යනුවේ—

දව, දිව්මෙහි යන් ධාතුනු කෙරෙන් පරව ආ ප්‍රත්‍යයව මාත්‍රාවෘඞ්ඪි කළකල්හි දෑවා, යනුවේ—

පසිත් නොයන්නේ යනවාක්‍යයෙහි පාශබ්ද පා කියාවෙයි ඔහුකෙරෙන් පරව නොශබ්දව ඔහු කෙරෙන් පරව වාගමත්හි යන ධාතු වාකියා ත්බෙයි විභක්තිසමාසවෙයි නකාරසමාසවෙයි පා ශබ්දයාගේ ආකාරයහට මාත්‍රාහානිවෙයි නොශබ්ද

යාංග ඔකාරයාට ලොප්කොට සිඬකළ කල්හි පන්වා, යනුවේ—

උරෙන්යනුයේ, යන වාක්‍යයෙහි උරශබ්දයා කෙරෙන්පරව කරණයෙහි එන් විභක්තිව උරෙන් යනානු කෙරෙන් පරව ගම ගමන්හි යන ධාතු ගම කියාවෙ ප්‍රත්‍යවත්කොට විභක්ති සමාසකොට ගමයනානුට ලොප්කොට උරයනානුගෙ අකාරයාට මාත්‍රාවෘඩිකළ කල්හි උරා, යනුවේ—

පා, යන ධාතුනු කෙරෙන් පරව ඇති ප්‍රත්‍යය කළකල්හි පැති, යනුවේ—

සොබ, ශෝබීමෙහියන ධාතුනු කෙරෙන් පරව අන ප්‍රත්‍යයකළ කල්හි සොබන, යනුවේ—

කොබන, ඇලලීමෙහි ලොබන, ලොබනයෙහි ලලන, ලලිතයෙහි ගලන, ගිලිහීමෙහි බබලන, බැබලීමෙහි යනමේ ධාතුනු කෙරෙන් පරව අන ප්‍රත්‍යයකොට සිඬකටයුතු—

වස, වැසීමෙහියන ධාතුනු කෙරෙන් පරව සදරුත් යනාදී සූත්‍රයෙන් නා ප්‍රත්‍යයකොට මාත්‍රාවෘඩි කළකල්හි වස්නා, යනුවේ—

තුස, තොස යෙහියන ධාතුනු කෙරෙන් පරව මෙම්ලෙස සිඬකළකල්හි තුස්නා, යනුවේ—

මුස, මොචනයෙහියන ධාතුනුකෙරෙන් පරව මෙමලෙස සිඬකළකල්හි මුස්නා, යනුවේ—

උපූර්වවූ, දල, දිලීමෙහියන ධාතුනුකෙරෙන් පරව අ ප්‍රත්‍යයකොට පිළිපෙරැළි කළකල්හි උදුල යනුවේ—

හම, හැමීමෙහි යන ධාතුනු කෙරෙන් පරව ල ප්‍රත්‍යයකළ කල්හි හමල, යනුවේ—

වහර, වැහැරීමෙහි යන ධාතුනු කෙරෙන් පරව රෙඑ යාම කාල ප්‍රත්‍යය කල කල්හි වහල, යනුවේ—

තුස, තිසීමෙයි යන ධාතුනු කෙරෙන් පරවඉ

ප්‍රත්‍යයකොට සකාරයාට තකාරාදෙස කොට පිළි පෙරළි කළකල්හි තිවි, යනුවේ—

සිට, සිටීමෙහි යන ධාතුහු කෙරෙන් පරව ඉ ප්‍රත්‍යයකළ කල්හි සිටි, යනුවේ—

කුමුද, කිමිදීමෙහි යන ධාතුහු කෙරෙන් පරව උ ප්‍රත්‍යයකොට දකාරයාට ටකාරකොට සිඬකළ කල්හි කුමුටු, යනුවේ—

කැප්, වෙව්ලීමෙහි යන ධාතුහු කෙරෙන් පරව ඉ ප්‍රත්‍යය කළ කල්හි කැපි, යනුවේ—

මේආදිය කර්තෘකාරක ප්‍රත්‍යයෙන් නිෂ්පන්නයි.

කොට, කෙටීමෙහි යන ධාතුහු කෙරෙන් පරව උ ප්‍රත්‍යය කොට මාත්‍රාහානි කළ කල්හි කෙටු, යනුවේ—

වට, වැටීමෙහි යන ධාතුහු කෙරෙන් පරව උ ප්‍රත්‍යය කොට මාත්‍රා වෘද්ධි කළ කල්හි වැටු, යනුවේ—

ගහට, ගැහැටීමෙහි යන ධාතුහු කෙරෙන් පරව උ ප්‍රත්‍යයකොට මාත්‍රා වෘද්ධිකළ කල්හි ගැහැටු, යනුවේ—

ව්පූව්වූසද, හැරීමෙහි යන ධාතුහු කෙරෙන් පරව උ ප්‍රත්‍යයකොට සකාරයාට හකාරකොට දකාරයාට ටකාරකොට පිළිපෙරළි කළකල්හි වූහුටු, යනුවේ—

දස, දැකීමෙහි යන ධාතුහු කෙරෙන් පරව උ ප්‍රත්‍යයව සකාරයාට ටකාරකොට දකාරයාට පිළිපෙරළි කළකල්හි දුටු, යනුවේ—

පපූව්වූව්ස, යන ධාතුහු කෙරෙන් පරව උ ප්‍රත්‍යයකොට සකාරයාට ටකාරාදෙසකොට පිළිපෙරළිකළකල්හි පිවිටු, යනුවේ—

කප, සිඳීමෙහි—සප, සැපීමෙහි-දප, දැපීමෙහි-බල, බැලීමෙහි—ගල, ගැලීමෙහි-දර, දැරීමෙහි-

පූර, පිරීමෙහි—චර, චැරීමෙහි—සර, සැරීමෙහි-මර, මැරීමෙහි—ඞල, චැලීමෙහි—යනමේ ධාතූන් කෙරෙන් පරව උ ප්‍රත්‍යයව පිළිපෙරළි කරණු-

හෙල, හෙලීමෙහි—නෙල, නෙළීමේහි-වෙල, වෙලීමේහි—යනමේ ධාතූන්කෙරෙණ් පරව උ ප්‍රත්‍යයකරණු—

පල, පැලීමෙහි යන ධාතුහු කෙරෙණ් පරව උ ප්‍රත්‍යයව මාත්‍රාවෘද්ධිකළකල්හි පැළු, යනුවේ—

ක්‍රී, කීමෙහියන ධාතුහු කෙරෙණ් පරව උ ප්‍රත්‍යයකොට යකාරාගම කළකල්හි කියූ, යනුවේ—

ලී, ලීමෙහියන ධාතුහුකෙරෙන් පරව උප්‍රත්‍යයකොට යකාරාගමව මාත්‍රාහානිව පිළිපෙරළිව ලියූ, යනුවේ—

පිය, වැසීමෙහි යන ධාතුහු කෙරෙන් පරව උ ප්‍රත්‍යය කළකල්හි පියූ, යනුවේ—

කල, කිරීමෙහි—හර, හැරීමෙහි—චර, වැරීමෙහි—යනමේධාතූන් කෙරෙන් පරව රෙඵයහට ළ කාරාදේසව අ ප්‍රත්‍ය කටයුතු—

සිද, සිඳීමෙහි—බිද, බිඳීමෙහි—හිද, හිඳීමෙහි—විද, විඳීමෙහි-යනමේ ධාතූන්කෙරෙන් පරව උත් ප්‍රත්‍යයව දකාරයන්ට ලොප්කොට සිඩකටයුතු—

දා, දීමෙහි යන ධාතූන් කෙරෙන් පරව උත් ප්‍රත්‍යය කටයුතු—

මේආදිය කර්මකාරක කර්තෘකාරක දෙකට

සමවූ ප්‍රත්‍යයෙන් නිෂ්පන්නයි.

යා, ගමනෙහි—වස, වැසීමෙහි-යනමේ ධාතූන් කෙරෙන් පරව අන් ප්‍රත්‍යය කටයුතු—

නා, නෑමෙහියන ධාතුහුකෙරෙන් පරව හනු ප්‍රත්‍යයව මාත්‍රාහානි කටයුතු—

කරයන, ධාතුහුකෙරෙන්පරව අ ප්‍රත්‍යයකටයුතු මේආදිය කරණකාරක ප්‍රත්‍යයෙන් නිෂ්පන්නයි.

දා, දීමෙහියන ධාතුහුකෙරෙන් පරව සදරුත යනාදි සූත්‍රයෙන් සම්ප්‍රදාන, නිප්‍රත්‍යයවේ—

මේසම්ප්‍රදාන, කාරකයෙන් නිෂ්පන්නයි.

බා, බීමෙහියන ධාතුහුකෙරෙන් පරව පෙරලෙසින් එම්ප්‍රත්‍යය කටයුතු—

මේ අවදිකාරක ප්‍රත්‍යයෙන් නිෂ්පන්නයි.

ඩු, ඩීමෙහියන ධාතුහු කෙරෙන් පරව ඉම්ප්‍රත්‍යයව වකාරයාට බකාරාදෙසකොට පිළිපෙරළි කටයුතු—

පූර, පිරීමෙහි යන ධාතුහු කෙරෙන් පරව අප්‍රත්‍යයකටයුතු—

මේ ආධාරකාරක ප්‍රත්‍යයෙන් නිෂ්පන්නයි.

කරණ්ඩ, කිරීම—දෙනු, දීම-වලඳනු වැලඳීමයි-මැගුම්, බැලීමයි-නැගුම්, නැගීමයි-සිඳුම්, සිඳීමයි.

මේ ආදිය භාවප්‍රත්‍යයෙන් නිෂ්පන්නයි.

මේ ධාතු ප්‍රත්‍යයයි.

මනු, ශබ්ද මනුකියානිබෙයි ඔහුකෙරෙන් පරව ෂෂ්ඨීවිභක්තිවෙයි ඔහුකෙරෙන් පරව, දසිත්න මිත්ගොත යනාදිසූත්‍රයෙන් වාප්‍රත්‍යයව විභක්ති ලොප් කොට නකාරයේ උකාරයාට ලොප්කළකල්හි මන්වා, යනුවේ—

දන්වා, යනුද මෙසේමැයි සමණහු පිත්, යනවාක්‍යයෙහි සූත්‍රාර්ථයෙහි පසවත්කොට සකාරයාට හකාරකොට මකාරයා රකාරාදෙසකොට පිළිපෙරළිකළකල්හි හෙරණ, යනුවේ—

සුගත්දෙව්, මොහටයන වාක්‍යයෙහි දෙවතාර්ථයෙහි පසවත්කොට ලොප්කොට පිළිපෙරළි කළකල්හි සෝගත්, යනුවේ—

වා ශබ්ද, වා කියා තිබෙයි ඔහු කෙරෙන් පරව ඹ ප්‍රත්‍යයව [illegible]කාරාගමව මාත්‍රා හානිව වයඹ, යනුවේ—

නකත්ශබ්ද නකත් කියා තිබෙයි ඔහු කෙරෙන් පරව ඉ ප්‍රත්‍යයව නකාරයහට මාත්‍රාවෘද්ධි කළකල්හි නැකති, යනුවේ—

පදනටඡිය, යනවාක්‍යයෙහි පදශබ්දයා කෙරෙන් පරව ඉ ප්‍රත්‍යයකළකල්හි පදි, යනුවේ—

දන ශබ්දයා කෙරෙන් පරව තා ප්‍රත්‍යයකොට පිළිපෙරැලි කළකල්හි දෙනෙතා, යනුවේ—

ලොශබ්ද ලෝ කියා තිබෙයි ඔහුකෙරෙන් පරව තා ප්‍රත්‍යය කළකල්හි ලොතා, යනුවේ—

ගම, ශබ්දයා කෙරෙන් පරව ඊ ප්‍රත්‍යයව මාත්‍රා වෘද්ධිකළකල්හි ගැමි, යනුවේ—

සඟ, ශබ්දයාකෙරෙන් පරව ඊ ප්‍රත්‍යයව සැඟී, යනුවේ—

රුවන්, ශබ්ද රුවන් කියාවෙ ඔහු කෙරෙන් පරව මුවා ප්‍රත්‍යයව රුවන් මුවා, යනුවේ—

දඹුමුවා, යනුද මෙසේමැයි—

තුරු, ශබ්දයා කෙරෙන් පරව වත් ප්‍රත්‍යයව තුරුවත්, යනුවේ—

නැව්, ශබ්දයා කෙරෙන් පරව ඉ ප්‍රත්‍යයවේ—

තොට, ශබ්දයා කෙරෙන් පරව ඉ ප්‍රත්‍යයවේ—

කිකරු, ශබ්දයා කෙරෙන් පරව උ ප්‍රත්‍යයවේ—

දමු, ශබ්දයා කෙරෙන් පරව උත් ප්‍රත්‍යය කළකල්හි දිමුත්, යනුවේ—

නිය, ශබ්දයා කෙරෙන් පරව වත්ප්‍රත්‍යය කළකල්හි නියවත්, යනුවේ—

බලකාර, ශබ්දයා කෙරෙන් පරව ඇත්ප්‍රත්‍යයමු පිළිපෙරළිවේ—

සබ, ශබ්දයා කෙරෙන් පරවූ ඉප්‍රත්‍යයවූ මාත්‍රා වෑඩිවූ සැබි, යනුවේ—

මෙම්ආදිය නාම්න්පරව
ඒ ඒ ප්‍රත්‍යයෙන් නිෂ්පනාහයි.

මෙම්ආදිය ඒ ඒ ප්‍රත්‍යයන්කොට ව්‍යවහාර්
යෙදෙන බැස් කරණු,

---

ලියන සන්නාය නිමි,

---

# ශුද්ධි පත්‍රය.

| පිටේ. | පේලේ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 1 | 12 | නකාසථ, | නාකාරසථ. |
| 14 | 17 | බූදු, | බුදු. |
| 19 | 21 | නම්වත්ව, | නම්වත්. |
| 21 | 24 | මිපල්, | මීපල්. |
| 28 | 25 | කරනා, | කරණේ. |
| 29 | 18 | උජ්ත්‍යය, | උ ප්‍රත්‍යය. |
| 31 | 3 | බත්වනත | ධාත්වනත. |
| 31 | 21 | පූර්වාස්වර | පූර්වස්වර. |
| 32 | 23 | නෙසූත්‍රයෙන් | යනසූත්‍රයෙ: |
| 32 | 31 | අකාශන් | අකාරශන්. |
| 34 | 6 | වච්ශබ්ද | වාච්‍යශබ්ද. |
| 34 | 21 | බූදුවත්නූ | බුදුවත්නුයේ. |
| 35 | 10 | බජව | බජවී. |
| 36 | 11 | සොමෙනනි | සොබනෙනි. |



